# නර්තනය

## ගුරු මාර්ගෝපදේශය

## 11 ශ්‍රේණිය

(2016 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)

සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපෑල : info@nie.lk

නර්තන
11 ශ්‍රේණිය
ගුරු මාර්ගෝපදේශය
ප්‍රථම මුද්‍රණය 2015
C ජාතික අධ්‍යාපන ආයතනය

**ISBN : .....................................**

සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : **www.nie.lk**
විද්‍යුත් තැපැල : **info@nie.lk**

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින්
මල්වාන, වඩුවේගම පාර, අංක 765/2, හි පිහිටි ආර්.එස්. ප්‍රින්ටෙක් පුද්. සමාගමෙහි
මුද්‍රණාලයේ මුද්‍රණය කරවා ප්‍රකාශයට පත් කරන ලදී.

## අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

මෙම ගුරු මාර්ගෝපදේශය මගින් ගුරුභවතාට තම පාසල තුළ විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන මූලික දැ සැපයේ. විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ දී තම කාර්යයන්, දරුවාගේ බුද්ධි වර්ධනය කෙරෙහි මෙන් ම, චර්යාත්මක දියුණුව කෙරෙහි දිගු කාලීන බලපෑමක් ඇති කරවන බව ගුරුවරුන් නිරන්තරයෙන් ම සිහි තබා ගත යුතු වේ.

ප්‍රජානන සාධන මානය සම්බන්ධයෙන්, අනෙක් කරුණු අතරට, ඉගෙනීම ඉහළ මට්ටමකට ගෙන යාමට පහත සඳහන් කරුණු කෙරෙහි ද ගුරුවරුන් සැලකිලිමත් විය යුතු වේ.

- ශිෂ්‍යයා තම ජීවිත අරමුණු පිළිබඳ අවදියෙන් සිටීම සහ කළ යුතු කාර්යය, හැකියාවන්ට සහ අරමුණු සාධනයට අදාළ වීම.

- ශිෂ්‍යයා ක්‍රියාකාරීව ඉගෙනුම් කාර්යාවලියෙහි නිරත වීම. (ඉගෙනුම් ශිෂ්‍ය කේන්ද්‍රීය ක්‍රියාවලියක් වීම.) කන්ෆියුසියස්ගේ කියමන සිහියට නගා ගන්න; ඇසෙන දේ අමතක වේ. දකින දේ අමතක නොවේ. කළ දේ ඉගෙන ගැනේ.

- ඉගෙනුම් වාතාවරණය, ධනාත්මක ව, අභියෝගාත්මක වී, ඉගෙනුම් මෙලවම්, උපකරණ, විද්‍යාගාර විවිධ සම්පත් ආකාරවලට පිවිසුම පහසු වීම.

- ශිෂ්‍යයාට ක්ෂණික ධනාත්මක සහ නිර්මාණාත්මක ප්‍රතිචාරයන් ලබා දීම මගින්, ඉගෙනුම ක්‍රමානුකූල ව ඉහළ මට්ටමක අවශෝෂණයකින්, ශිෂ්‍යයාගේ දැනුම, කුසලතා සහ අරමුණු සමග අනුකලනයකට අවකාශ ඇති කිරීම.

අධ්‍යාපනයේ දී, රජයේ අපේක්ෂාව වනුයේ සියලු පාසල්වල සියලු දරුවන්ට, මූලික විෂය කරුණු අවශ්‍ය මට්ටමකට ග්‍රහණය කිරීමෙන්, විභාගයට මුහුණ දීමෙන් පසුව සාර්ථකත්වයේ සතුට විඳ ගැනීමේ හැකියාව ලබා දීම ය.

දරුවාගේ චර්යාත්මක වර්ධනයට අදාළ මානය සලකා බැලූ විට අධ්‍යාපනයේ පරමාර්ථය වනුයේ ප්‍රජානන හැකියාවන් වැඩ ලෝකය සමග සම්බන්ධ කිරීමයි. එබැවින් ගුරුවරුන් තමතින් විෂය නිර්දේශ ලබා දීමේ දී වර්ධනය කළ යුතු වන්නේ, පාසලින් බැහැර ලෝකය සමග ගනුදෙනු කිරීමට ශිෂ්‍යයාට අවශ්‍ය වන, දක්ෂතා සහ කුසලතා ය. එයින් සමහර වැදගත් ගණයේ හැකියාවන් පහත සඳහන් ක්ෂෙත්‍රයන්හි වේ.

- ක්‍රියාශීලී වැඩ ආචාර ධර්ම - සාධනීය ආකල්ප සහ නව නිර්මාණයට, සංරක්ෂණයට ඇති ළැදියාව

- අන්තර් පුද්ගල සම්බන්ධතා - කණ්ඩායම් වැඩ, විනය හා කාර්යක්ෂම සන්නිවේදනය

- සදාචාරාත්මක හර - විවිධත්වයට ගරු කිරීම වැනි පුරවැසි වටිනාකම්වලින් හෙබි, ඍජු පුද්ගලයෙක්

අවසාන වශයෙන් මම සියලු විදුහල්පතිවරුන්ටත්, ගුරු භවතුන්ටත්, පාසල්වල අනෙක් කාර්ය මණ්ඩල සභිකයන්ටත්, ඉතා ඕනෑකමින් ඉගෙනුම් ඉගැන්වීම ක්‍රියාවලිය දෙස කළමනාකරණයේ ඒ 4 වශයෙන් හඳුන්වන පහත සඳහන් කරුණු මගින් තම සැලකිල්ල යොමු කරන මෙන් ඉල්ලීමට කැමැත්තෙමි. එනම් ආකල්පය, විශ්ලේෂණය, ක්‍රියාව සහ වගවීමයි. ඔබ නියුක්ත වන කාර්යයෙහි (පාඩම ආදි වශයෙන්) අවසානයත්, මාර්ගයත් පිළිබඳ අදාළ සාධනීය ආකල්පයන්ගෙන් ආරම්භ කරන්න. එය සංවිධානය කර ගැනීම උදෙසා (වරු, ඒකක ආදි වශයෙන්) තොරතුරු සොයා බලා ලබා ගෙන ඒවා විශ්ලේෂණය කරන්න. විකල්ප සොයා බලා ක්ෂණික ක්‍රියා (ප්‍රකාශ කිරීම, බාරදීම) කාර්යක්ෂම ව ගන්න. ඔබ ප්‍රතිඵල අධීක්ෂණය, ඇගැයීම සහ මිනුම සම්බන්ධයෙන් (අයිතිය) වගකීම බාර ගන්න.

මේ හා සම්බන්ධ සියලු ගුරු භවතුන්ට, ඉගැන්වීමේ දීත් ඉගෙනීමේ දීත් සතුට අත්වේවා යයි ප්‍රාර්ථනා කිරීමට මම මෙය අවස්ථාව කර ගනිමි. අවශ්‍ය වුවහොත් මට ද පිටපතක් සහිතව ජාතික අධ්‍යාපන ආයතනයේ අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට මෙම ගුරු මාර්ගෝපදේශය පිළිබඳ ඔබේ අත්දැකීම් සහ නිරීක්ෂණ ලියා දන්වා එවීමට නොපසුබට වන්න.

මහාචාර්ය ගුණපාල නානායක්කාර
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම

# නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

ඉගෙනුම, පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත්කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනාගත් අසම්මතයන් බැහැර කිරීමට ද සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කරගනු ලබන්නේ ඉගෙනුමයි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂය මාලාව, විෂය නිර්දේශ, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක්වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතාවන් මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කරගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණයන් තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂය මාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වාගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශයන්හි ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක්වත් වෙනස් නොකොට පිළිපැදිය යුත්තක් නම් නොවේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා විෂය අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස්කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලිව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන, පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශ ශික්ෂකයාහට ද දෙගුරුනට ද භාවිත කළ හැක. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දැන ගුරුභවතුන් ගුරු මාර්ගෝපදේශ හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සම්පාදිත අදාළ පෙළ පොත යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගැයීම් සිදුකරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුව ද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමග ප්‍රත්‍යක්ෂකරණයට පත්විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කරගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

**පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**
**භාෂා මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය.**

# පෙරවදන

සමාජ ප්‍රගමනයෙහි ලා මහඟු මෙහෙවරක නියැලෙන්නන් අතර ගුරුවරු ප්‍රමුඛ වෙති. ස්වකීය ජීවිතය සකස් කර ගැනීම සඳහා දරුවන්ට මග පෙන්වන්නෝ ගුරුවරු ය.

2015 වර්ෂයේ සිට ක්‍රියාත්මක කෙරෙන නව විෂය නිර්දේශයට අදාළ ඉගැන්වීම් කටයුතු සාර්ථක කර ගැනීම සඳහා ගුරුවරුන්ට පහසුකම් සැපයීමේ අරමුණින් මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ මුද්‍රණය කර බෙදා හැරීමට අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව කටයුතු කරයි. ජාතික අධ්‍යාපන ආයතනය මගින් සම්පාදිත මේ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ, දරුවන්ට මනා ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කර දීමට අවශ්‍ය මග පෙන්වීම ගුරුවරුන් වන ඔබ වෙත ලබා දෙනු ඇතැයි යන්න මාගේ විශ්වාසය යි.

මේ ප්‍රයත්නය යථාර්ථයක් වන්නේ මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය පරිශීලනයෙන් ලබන පරිචය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා යොදා ගැනීමට දරන උත්සාහය මත ය. ඒ සඳ කාර්යය සඳහා කැප වී සිටින ඔබට මාගේ ගෞරවය පිරිනමමි.

**තිස්ස හේවාවිතාන**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
ඉසුරුපාය,
බත්තරමුල්ල.
2015.09.22

# විෂයමාලා කමිටුව

| | |
|---|---|
| **උපදේශකත්වය හා අනුමැතිය** | ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| **විෂය සම්බන්ධීකරණය** | එස්. වර්ණසිංහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,<br>සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව,<br>ජාතික අධ්‍යාපන ආයතනය. |

**ලේඛක මණ්ඩලය**

අභ්‍යන්තර

එස්. වර්ණසිංහ මහතා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,
- බුද්ධි කල්‍යාණි මුතුකුමාරණ මහත්මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,
- බී. එම්. එස්. ද සොයිසා මහත්මිය - කථිකාචාර්ය,

සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය.

බාහිර

- ගුණසේන රාජපක්ෂ මහතා - ජ්‍යෙ. කථිකාචාර්ය (විශ්‍රාමික)
  ගුරු අභ්‍යාස විදුහල, ගිරාගම.
- කේ. සිරිල් මීගම මහතා-ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (විශ්‍රාමික)
  ගුරු අභ්‍යාස විදුහල, ගිරාගම.
- ජයන්තා හෙට්ටියවත්ත මහත්මිය -සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ,
  කලාප අධ්‍යාපන කාර්යාලය, හෝමාගම.
- කේ. සුසන්ත ගුණවර්ධන මහතා- සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ,
  කලාප අධ්‍යාපන කාර්යාලය, පිළිමතලාව.

.

ඩී.එෆ්.පී.එස්.ඩී. පෙරේරා මහතා - සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ
කලාප අධ්‍යාපන කාර්යාලය, කැලණිය
කේ.එල්.එම්.ඒ. ධර්මලතා මහත්මිය - ගුරු උපදේශක
කලාප අධ්‍යාපන කාර්යාලය, දෙහිඕවිට

- ඒ. ඩබ්. බියංකා එම්. අබේසිංහ මහත්මිය - ගුරු සේවය,
  බප/ජය/ධර්මපාල විදුහල, පන්නිපිටිය.

.

| | |
|---|---|
| **විෂය සංස්කාරක මණ්ඩලය** | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය මුදියන්සේ දිසානායක මහතා<br>මහාචාර්ය ලයනල් බෙන්තරගේ මහතා<br>මහාචාර්ය ආරියරත්න කලුආරච්චි මහතා<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වික්‍රමසිංහ බණ්ඩාර මහතා<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය අසෝකා දිසානායක මහත්මිය<br>ආචාර්ය ශ්‍රියානි රාජපක්ෂ මහත්මිය<br>සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය, කොළඹ 07. |
| **භාෂා සංස්කරණය** | එස්.ඕ. ප්‍රනාන්දු මහතා - අධ්‍යක්ෂ (විශ්‍රාමික)<br>ඊ.ආර්. නිමල් ප්‍රේමකුමාර මහතා<br>සිංහල භාෂා දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය. |

## ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

නර්තන විෂය ඉගෙනීම 6 ශ්‍රේණියෙන් අරඹන ශිෂ්‍යයාට එහි ප්‍රායෝගික තත්ත්වය අනුව සතුටින් අදාළ ක්‍රියාකාරකම් හි යෙදීමට අවකාශය සලසා දීම සඳහා සැලසුම්ගත වැඩ පිළිවෙළක් සකස් වීම අත්‍යවශ්‍ය වේ. මෙහි දී ශිෂ්‍යයින්ගේ ක්‍රියාශීලිත්වය හා උද්යෝගය වර්ධනයට අවශ්‍ය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමශිල්ප භාවිතයට ගැනීම වැදගත් කොට සැලකිය යුතු ය.

මෙම ගුරු මාර්ගෝපදේශයේ ඇතුළත් කර ඇත්තේ පාඩම් ආදර්ශයක් පමණි. ශිෂ්‍යයා ජීවත් වන ප්‍රදේශය, පවතින සම්පත්, ශිෂ්‍යයින්ගේ සාධනය හා තවත් කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් පාඩම් සැලසුම් කර ගැනීම වැදගත් ය. පාසලේ පවතින සම්පත් මෙන් ම ගුරුවරයා විසින් ගොඩනගා ගන්නා සම්පත් ඇසුරු කර ගනිමින් වඩාත් ඵලදායි අධ්‍යාපනයක් ලබාදීම අප කාගෙත් යුතුකමකි. ඒ සඳහා අවශ්‍ය ගුණාත්මක යෙදවුම් භාවිතයට ගැනීම වැදගත් වේ. ඒ අතර තාක්ෂණික මෙවලම් භාවිත කරමින් ගුණාත්මක අත්දැකීම් ශිෂ්‍යයින් අතට පත් කිරීම කාලීන අවශ්‍යතාවක් සේ සැලකිය යුතු ය.

නිපුණතා පාදක අධ්‍යාපන ක්‍රියාවලිය තුළ සෑම ක්‍රියාකාරමක් ආරම්භයේදී ම සුදුසු ප්‍රවේශයක් භාවිතයට ගැනීම වැදගත් ය. ශිෂ්‍යයාගේ කායික හා මානසික වර්ධනයට අවශ්‍ය පරිදි ක්‍රියාකාරකම් සැලසුම් සූදානම්කර ගන්නේ නම් වඩාත් ඵලදායි වනු ඇත.
නර්තන විෂයෙහි ස්වභාවය අනුව දැනුම,කුසලතා, ආකල්ප මෙන් ම හොඳ ජීවන පුරුදු වර්ධනය කිරීමට අවශ්‍ය ක්‍රියාකාරකම් සමූහයක් මෙම ගුරු මාර්ගෝපදේශයට ඇතුළත් කර ඇත. ඒවා ක්‍රමානුකූල ව සැලසුම් කර ගනිමින් ක්‍රියාත්මක කිරීම ගුරුවරයාගේ කාර්ය භාරය වේ. ඒ සඳහා පහත සඳහන් උපදෙස් අනුගමනය කරන්නේ නම් වඩාත් ඵලදායි වනු ඇත.

- ක්‍රියාකාරකම් සැලසුම ගුරුවරයාට අවශ්‍ය පරිදි සැලසුම් කරගත හැකි මුත් ඊට අදාළ ඉගෙනුම් පල කෙරෙහි අවධානය යොමු කළ යුතු ය.
- ගුණාත්මක යෙදවුම් සඳහා අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ පාඩම ආරම්භ කිරීමට පෙර සැලසුම් කර සූදානම් කර ගත යුතු ය.
- වාර සටහනට අනුව නියමිත පාඩම් ක්‍රියාත්මක කිරීමේ දී ශිෂ්‍යයින්ගේ කායික හා මානසික වර්ධනයට අවශ්‍ය පරිදි පාඩම් පෙළ ගැස්වීම කළ යුතු වේ.
- ගුරු මාර්ගෝපදේශයේ දැක්වෙන පාඩම්වලට අදාළ කාලච්ඡේද ප්‍රමාණවත් පරිදි දක්වා ඇති බැවින් ඊට අදාළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් සකස්කර ගැනීම වැදගත් ය.
- අදාළ ක්‍රියාකාරකමට ඇමුණුම් හා කාර්ය පත්‍රිකා සකස්කර ගැනීම කළ යුතු ය. ශිෂ්‍යයාගේ ඉගෙනුමට මග පාදන අයුරින් ඒවා සකස්කර ගත යුතු අතර විවිධ විධික්‍රම භාවිතයට ගන්නේ නම් වඩාත් ඵලදායි වනු ඇත. (චාර්ට්, සටහන්, වගු, ප්‍රහේලිකා, පැවරුම් භූමිකා රංගන ආදිය)
- ගුරු මාර්ගෝපදේශයෙ හි නිපුණතා මට්ටම් 4.1-4.2 අයත් ක්‍රියාකාරකම වාර තුනට ම අදාළ වන ලෙස විෂය අන්තර්ගතය ඇතුළත් වන පරිදි සකසා ගත යුතු ය.
  උදා: ජනගායන- වාර සටහන බලන්න

- ඇගයීම් හා තක්සේරුකරණයට අවශ්‍ය මූලික ක්‍රියාවලින් කීපයක් දක්වා ඇතත් ශිෂ්‍ය සාධනය නිරීක්ෂණය කිරීමට අවශ්‍ය ඇගයීම් උපකරණ සකස් කර ගන්නේ නම් වඩාත් ඵලදායි වනු ඇත. මීට අමතර ව පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ පොත පරිශීලනය කරන්නේ නම් මැනවි.
  මේ උපදෙස් සමගින් ගුණාත්මක ඉගෙනුම් ක්‍රියාවලියක් ගොඩනගමින් ගුණ නැණ බෙලෙන් යුත් ශිෂ්‍ය පරපුරක් ජාතියට උරුම කිරීමට හැකි වේවායි පතමු.

# පටුන


| | පිටුව |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය | iii - iv |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය | v |
| විෂයමාලා කමිටුව | vii |
| මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | viii |
| විෂය නිර්දේශයේ අන්තර්ගතය | x |
| ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | 1-36 |

# විෂය නිර්දේශයේ අන්තර්ගතය

## විෂය හැඳින්වීම

අපේ මාතෘ භූමියටත්, සංස්කෘතියටත්, සොබාදහම හා සමස්ත ජීව, අජීව විශ්ව ධාතුවටත් හිතකාමී පුරවැසියකු නිර්මාණය කිරීමේ පුළුල් ජාතික පරමාර්ථයෙන් පාසල් පද්ධතිය තුළ දරුවන්ට ඉගෙනීමට ලැබෙන සුවිශේෂතම විෂයය සෞන්දර්ය විෂයයි. එය ජාතික අධ්‍යාපන ආයතනයේ සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව ලෙස අප විසින් හඳුනා ගන්නාලද පහත දැක්වෙන සෞන්දර්ය විෂයයේ ජාතික දැක්ම කියැවීමෙන් ඔබට මැනවින් අවබෝධ වනු ඇත.

සෞන්දර්යයෙන් සංස්කෘතිකමය ලැදියා පුබුදුවා, එමඟින් නිර්මාණශීලී බව, සංවේදීතාව, දරා ගැනීම, ශ්‍රී ලාංකේය අනන්‍යතාව හා දේශානුරාගය වඩවා මාතෘ භූමිය කෙරෙහි සංවේදී වූ දරු කැලක් හා සමාජයක් බිහි කිරීම.

("To sensitize students and the community through aesthetics to the Mother Land, endowed with cultural pride, creativity, sensitivity, tolerance, partriotism and a sense of national identity")

දේශය ගොඩනැංවීමේ දී විශ්වය සමග යහ සබඳතා පවත්වා ගනිමින් පෙරට යන අනාගත පුරවැසියා කෙසේ විය යුතු ද යන්න ගැඹුරින් විමසා බැලීමත් සමඟ මෙතෙක් පැවති සෞන්දර්ය විෂයයේ ජාතික දැක්ම අතික්‍රමණය කොට මෙම 2015 නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණය දෙස නවමු දෘෂ්ටියක් හෙළා ඇති බව එනයින් ම ඔබට පැහැදිලි වනු ඇත.

උසස් රසඥතා ඥානයකින් යුතු මානව හිතවාදී චින්තනයෙහි හෙබි ක්‍රියාශීලී සමාජානුයෝගී පුරවැසියකු ලෙස වැඩ ලෝකයට පිවිසීමට සෞන්දර්ය අධ්‍යාපනයෙන් ලබන ආධ්‍යාත්මික හා ශාරීරික ප්‍රබෝධය ඉවහල් කරගැනීම අද්‍යතන සමාජ අවශ්‍යතාවකි.

සෞන්දර්ය අධ්‍යාපනයෙන් දරුවකු තුළ සොඳුරු මෙන් ම නිර්මාණශීලී හැකියාවන් හා චින්තනය ප්‍රවර්ධනය කිරීම ද විනය ගරුක, සදාචාරවත් අභිමානවත් පුරවැසියකු තැනීමේ වගකීම ඉටු කිරීම ද දෙවැනි වන්නේ ආගමෙන් මිනිසාට සැලසෙන සේවාවට පමණි.

එබැවින් විද්‍යා, ගණිත, වාණිජ, තාක්ෂණ හා භාෂා විෂයයන්ගෙන් ඥානනය වන මිනිස් සත්ත්වයාට මිනිස් ගුණ උරුම කරදෙන සෞන්දර්ය අධ්‍යාපනික විෂයයන් ඉගෙනීම එදාටත් වඩා අදට සහ හෙටට අත්‍යවශ්‍ය ම බැව් තරයේ ම කිව යුතු ව ඇත.

මෙම විෂයමාලා ප්‍රතිසංස්කරණයත් සමග අභිනවයෙන් 6 ශ්‍රේණියට පැමිණෙන දරුවන් නවමු චින්තනයක් ඇති අළුත් පරපුරක් ලෙස තැනුම උදෙසා පළමු ක්‍රියාකාරකමින් ම ස්වයං පෙලඹවීමක් ඇති වන පරිදි කැමැත්ත හා විශ්වාසය ගුරුවරයා විසින් දිනා ගත යුතු ය. ඒ සඳහා ටිබෙට් ජාතික එස්. මහින්ද හිමියන් අතින් විරචිත "ප්‍රාර්ථනාව" නම් වූ කුඩා ළමා ගීයක් දරුවාගේ ජීවන ප්‍රතිඥාවක් ලෙස දිනපතා පාඩම ඇරඹුමට පෙර ගැයුමට අපි යෝජනා කරමු.

| | | | |
|---|---|---|---|
| ස ස ස - | ස ස ස - | රි රි රි - | රි රි රි - |
| හො ඳ දේ s | හි ත මී s | හි තු දේ s | කි ය මී s |
| ස රි ස රි | ස ස රි - | රි ස රි ස | ස ස ස - |
| කි යු දේ s | ක ර මී s | ක ර මි න් | හැ දෙ මී s |

මෙම ප්‍රවේශයත් සමග ඇරඹෙන සෞන්දර්යයේ වින්දනාත්මක ඉගෙනුම ජාතික, සංස්කෘතික අනන්‍යතා හා විවිධ සම්ප්‍රදායයන් ස්පර්ශ කරමින් විශ්ව චින්තනයක් කරා දරුවාගේ දැනුම, හැකියා හා ආකල්ප පුළුල් කර ගැනීමට හැකි වන පරිදි විෂය කරුණු මෙහිදී අධ්‍යාපනික හා මනෝ විද්‍යාත්මක පදනමින් යුතු ව ක්‍රමික ව පෙළ ගස්වා ඇත.

එහි දී නායකත්වය, සහභාගිත්වය, ඉදිරිපත් වීම, සුහදත්වය, සාමූහිකත්වය, ඇගැයීම, සවන්දීම, පිළිගැනීම, බෙදාහදා ගැනීම, අන්‍යයන්ට ගරු කිරීම ආදි ආකල්ප සෑම සිසුවකු තුළ ම වර්ධනයට අවස්ථාව සැලසෙන පරිදි අප විසින් යෝජිත ක්‍රියාකාරකම් තවදුරටත් සංවර්ධනය කරමින් ඉගෙනුම් ඉගැන්වීම් පරිසරය සකසා ගැනීමට ගුරුවරයා වශයෙන් ඔබට ද ඉඩකඩ ඇත.

තව ද දෛනික ජීවිතයේ දී මුහුණ දෙන විවිධ ගැටලුවලට සාර්ථක ව මුහුණ දී තර්කානුකූල ව හා නිර්මාණාත්මක ව චින්තනය මෙහෙයවා ඒවා විසඳාගැනීමට අවශ්‍ය පුද්ගල ශක්‍යතා වර්ධනය කිරීමට ද අප විසින් වත්මන් පරපුරට දායකත්වය සැපයිය යුතු ව ඇත.

එබැවින් ගුරු භවතුන් ලෙස ඔබ මෙම ගුරු මාර්ගෝපදේශය පෙරට වඩා හොඳින් පරිශීලනය කරන්නේ නම් ඔබගේ ද චිත්තනයට අලුත් ආලෝකයක් හා ප්‍රබෝධයක් ලැබෙනු ඇත. ඒ ආලෝක කිරණ ජාතියේ දරු කැල මත පතිත ව ඔවුන් ද ඉමහත් ප්‍රබෝධයෙන් මෙම විෂයය ඉගෙනීමට යොමු වනු නො අනුමාන ය.

එසේ ම කායික හා මානසික සමබරතාවෙන් හෙබි සෞඛ්‍ය සම්පන්න මෙන් ම නීරෝගී දිවිපෙවතක් ගත කිරීමට අවශ්‍ය පුද්ගල ශක්‍යතා සංවර්ධනය කිරීම හා යහපත් අන්තර් පුද්ගල සම්බන්ධතා ගොඩනංවා ගනිමින් ජාතික හා ජාත්‍යන්තර තලයේ නොසැලී කටයුතු කිරීමට විචාරශීලී මනසකින් හෙබි පුද්ගලයකු බිහි කිරීමට වගවීම සෞන්දර්ය අධ්‍යාපන විෂය භාර ව කටයුතු කරන ඔබ අප සැමගේ වගකීම වේ.

ඒ සඳහා 2016 වසරේ දී ක්‍රියාත්මක වන 11 ශ්‍රේණිය විෂය නිර්දේශය හා මෙම නව ප්‍රතිසංස්කරණ

දරුවන් හරහා අපි සැම නවමු ලොවකට පිවිසීමේ වැදගත් අවස්ථාවක් ලෙස දකිමින් අධිෂ්ඨානයෙන් කැප වීමෙන් වඩාත් ඵලදායි සේවාවක් සැලසීමට කැප වෙමු.

**අධ්‍යක්ෂ (සෞන්දර්ය)**
**ජාතික අධ්‍යාපන ආයතනය**

# ජාතික අධ්‍යාපන පද්ධතිය සඳහා අරමුණු

## ජාතික අරමුණු

දෛනික ජීවිතය සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟාවීම සඳහා පුද්ගලයන්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතිය සහාය විය යුතු ය. වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබී ය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලීන් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟා කරගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනාගෙන ඇත. මෙම අරමුණු සපුරා ගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

1. මානව අභිමානයට ගරු කිරීමේ සංක්ලපය මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින්, ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම හ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැගීම සහ ලාංකේය අනන්‍යතාව තහවුරු කිරීම.

2. වෙනස් වන ලෝකයක අභියෝගයනට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැගි දායාදයන් හඳුනාගැනීම සහ සංරක්ෂණය කිරීම.

3. මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග වර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වාගෙන යාමට සහාය වීම.

4. පුද්ගලයන්ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම.

5. සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම.

6. පුද්ගලයාගේ සහ ජාතියේ ජීව ගුණය වැඩි දියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම.

7. සීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැසීමට හා ඒවා පාලනය කරගැනීමට පුද්ගලයන් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම.

8. ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවණීය ස්ථානයක් හිමි කරගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා, පෝෂණය කිරීම.

# මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන්පත් කරගැනීමට දායක වනු ඇත.

1. **සන්නිවේදන නිපුණතා :**

   සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනු කාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

**සාක්ෂරතාව :** සාවධාන ව ඇහුම්කන් දීම, පැහැදිලි ව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලාදායී අයුරින් අදහස් හුවමාරු කරගැනීම

**සංඛ්‍යා පිළිබඳ දැනුම :** භාණ්ඩ, අවකාශය සහ කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

**රූපක භාවිතය :** රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති හා වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම.

**තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය :** පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද, සේවා පරිශ්‍රයන් තුළ දී ද, පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කරගැනීම.

2. **පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා :**
   - නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
   - ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම වැනි අගයන්
   - චිත්තවේගී බුද්ධිය

3. **පරිසරයට අදාළ නිපුණතා :**

   මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයන්ට අදාළ වේ.

**සමාජ පරිසරය :** ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්.

**ජෛව පරිසරය :** සජීවී ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීව - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා

**භෞතික පරිසරය :** අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතා, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සැප පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මළ බැහැර කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව ඉගැනීම, වැඩ කිරීම සහ ජීවත්වීම සඳහා මෙවලම් හා තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

**4. වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා :**

ආර්ථික සංවර්ධනයට දායක වීම. තම වෘත්තිය ලැදියා සහ අභියෝග්‍යතා හඳුනාගැනීම. හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම යන හැකියාවන් උපරි ම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා.

**5. ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා :**

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල ව හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයන් උකහා ගැනීම හා ස්වීයකරණය.

**6. ක්‍රීඩාව හා විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා :**

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්.

**7. ඉගෙනීමට ඉගෙනුම් පිළිබඳ නිපුණතා :**

සීඝ්‍රයෙන් වෙනස් වන, සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගැන්වීමත් සඳහා පුද්ගලයන්ට ශක්තිය ලබා දීම.

(ඉහත ජාතික අරමුණු හා මූලික නිපුණතා ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති රාමුවක් සඳහා යෝජනා ඇතුළත් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2003 දෙසැම්බර් වාර්තාවෙන් උපුටා ගැනිණ.)

# නර්තන විෂයේ අරමුණු

- පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කරගනිමින් උසස් නිමාවකින් යුත් කලා කෘති බිහි කිරීම මෙන් ම ජීවිතයේ දී මුහුණපාන විවිධ ගැටලු නිර්මාණශීලී ව විසඳා ගැනීම සඳහා අවශ්‍ය චින්තනය හා නිර්මාණ කුසලතා ප්‍රවර්ධනය කිරීම.

- නර්තන විෂය හා බැඳි ක්‍රියාකාරකම් මගින් අනාගත වැඩ ලෝකයට මුහුණ දිය හැකි ක්‍රියාකාරීත්වය මෙන් ම සමාජයෙහි උසස් ජීවන තත්ත්වයක් ගොඩ නඟාගැනීම සඳහා අවශ්‍ය සාමාජීය හා පෞද්ගලික ශක්‍යතා වර්ධනය කිරීම.

- සන්නිවේදන මාධ්‍ය ඔස්සේ ප්‍රචාරය කරන වැඩසටහන් අතරින් හරවත් හා යෝග්‍ය වැඩසටහන් තෝරා ගැනීම සඳහා අවශ්‍ය විචාර ශක්ති වර්ධනය, රසඥතා වර්ධනය හා නිවැරදි තීරණ ගැනීමේ හැකියාව ලබා දීම.

- දේශීය, විදේශීය නර්තන හා සබැඳි සංස්කෘතික ලක්ෂණ අධ්‍යයනය මගින් විවිධ සංස්කෘති අගය කිරීම මෙන් ම ජාත්‍යන්තර සමාජයේ දී දේශීය අනන්‍යතාව ආරක්ෂා වන පරිදි කටයුතු කිරීම සඳහා අවශ්‍ය උදාර හැඟීම්, ආකල්ප සංවර්ධනය කිරීම.

- නර්තන විෂය හා බැඳි සංස්කෘතික පසුබිම හා සෙසු සංස්කෘති සතු හරයන් හඳුනාගනිමින් පුද්ගල අභිමානයට ගරු කරන මානව සම්පත් ප්‍රවර්ධනය කිරීම.

- සාර්ථක දිවි පෙවෙතක් ගත කිරීමට අවශ්‍ය කායික හා මානසික සුව සම්පත් වර්ධනය සඳහා නර්තන විෂය හා සබැඳි ක්‍රියාකාරකම් භාවිතයට ගැනීමේ හැකියාව සංවර්ධනය කිරීම.

## 11 ශ්‍රේණිය නර්තන විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1.0 පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරුකර ගනිමින් නර්තන නිර්මාණ කරයි. | 1.1 භාව ප්‍රකාශන වන පරිදි චරිත නිරූපණය කරයි. | • භාව ප්‍රකාශනය - ශාන්ත භාවය ප්‍රදර්ශනය කිරීමට සුදුසු සිද්ධියක් ඇසුරෙන් | ශාන්ත භාවය ප්‍රකාශ වන පරදි චරිත නිරූපනය කරයි. | 03 |
| | 1.2 තේමාවක් අනුව චරිත නිරූපණය කරයි. | • විවිධ භාව ප්‍රකාශනය වන පරිදි තේමාවක් අනුව නර්තන මාධ්‍ය කොට ගෙන චරිත නිරූපණය | සිද්ධියක් අනුව විවිධ භාව ප්‍රකාශවන පරිදි නර්තන මාධ්‍යයෙන් චරිත නිරූපණය කරයි. | 04 |
| | 1.3 ගැමි නැටුම් හා සබැඳි සුවිශේෂ ලක්ෂණ හඳුනා ගනිමින් නර්තන නිර්මාණ කරයි. | • කඩු නැටුම/මෝල්ගස් නැටුම- සුවිශේෂ ලක්ෂණ,<br>• නර්තන නිර්මාණය | කඩු /මෝල්ගස් නැටුම හා සබැඳි සුවිශේෂ ලක්ෂණ හඳුනා ගනිමින් ගැමි නැටුමක් නිර්මාණ කරයි. | 05 |
| 2.0 නර්තන හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | 2.1 නිවැරදි අංගහාර ප්‍රදර්ශනය කරමින් සරඹ ඉදිරිපත් කරයි. | • ගොඩ සරඹ/ ඉලංගම් සරඹ/ දොඹින පද 1-12 දක්වා කස්තිරම්/ ඉරට්ටිය/හමාර පද සමගින්<br>• විලම්භ, මධ්‍ය සහ දෘත ලයට | සරඹ පද 1- 12 දක්වා විලම්භ, මධ්‍ය, දෘත ලයට නිවැරදි අංගහාර සහිතව ඉදිරිපත් කරමින් ඒවායේ අවසන් කිරීමේ පද ප්‍රදර්ශනය කරයි. | 05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 2.2 ශිල්පීය විධික්‍රම අනුගමනය කරමින් සාම්ප්‍රදායික නර්තන අංග ප්‍රදර්ශනය කරයි. | • මුසලඩි වන්නම/ ශුද්ධ තාලය/කොවුලා වන්නම<br>• 6 - 10 ශ්‍රේණි දක්වා ඉගෙන ගන්නා ලද සියලු ම වන්නම්<br>• ආරම්භක පදය සමග කුදාංත ගතදොං වට්ටම මාත්‍රා දෙකක් කස්තිරම්, අඩව් සමග/<br>•ගුදගතිගත වට්ටමේ 3, 4 මාත්‍රා දෙකක් ඉරට්ටි සමග/<br>• පට්ටුතල් මාත්‍රය අලංකාර මාත්‍රා දෙකක් කලාසම්, අඩව් සමගින් | ගායනය සහිත හා රහිත නර්තන අංග ශිල්පීය විධික්‍රම අනුගමනය කරමින් ඉදිරිපත් කරයි. | 07<br><br>03 |
| | 2.3 ප්‍රස්තාරකරණයේ දී විධික්‍රම අනුගමනය කරයි. | • තුත් තිතේ ප්‍රභේද<br>• කඩු , මෝල්ගස්, ග්‍රහපංති<br>• වන්නම්, වට්ටම්/පට්ටුතල් මාත්‍රය | තුන් තිතේ ප්‍රභේද හඳුනා ගනිමින් ගායනය සහිත හා රහිත නර්තන අංගවල කොටස් විධික්‍රම අනුගමනය කරමින් ප්‍රස්තාර කරයි. | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 2.4 රස හා භාව පිළිබඳ විස්තර කරයි. | • රස හා භාව පිළිබඳ විස්තර | රස හා භාව හඳුනාගනිමින් ඒ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි. | 02 |
| | 2.5 සිංහල හා දෙමළ ගැමි නැටුම් පිළිබඳ තුලනාත්මක ව කරුණු දක්වයි. | • නර්තන අංග භාවිත වන අවස්ථා<br>• ගායන , වාදන , රංග වස්ත්‍රාභරණ , රංග උපකරණ තුලනාත්මක ව | සිංහල හා දෙමළ ගැමි නැටුම් වල සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් එහි තුලනාත්මක ලක්ෂණ විස්තර කරයි. | 02 |
| | 2.6 නර්තන කලාව හා අනෙකුත් කලාවන් අතර සහ සම්බන්ධතාව විමසුමට ලක් කරයි. | • චිත්‍ර, නර්තන, සංගීත , නාට්‍ය | නර්තන කලාව හා අනෙකුත් කලාවන් අතර පවතින සම්බන්ධතාව විමර්ශනය කරමින් ඒවායේ භාවිත අවස්ථා විස්තර කරයි. | 03 |

11 ශ්‍රේණිය නර්තන විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 3.0 සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ හඳුනා ගනිමින් වාදන කුසලතා ප්‍රදර්ශනය කරයි. | 3.1 බෙර වාදනය හා සබැඳි මූලික සරඹ වාදනය කරයි. | • 1-3 බෙර සරඹ අභ්‍යාස | 1-3 බෙර සරඹ ශිල්පීය විධික්‍රම අනුගමනය කරමින් වාදනය කරයි. | 02 |
| | 3.2 නිවැරදි ශිල්පීය ක්‍රම අනුගමනය කරමින් බෙර වාදනය කරයි. | • මැදුම් මහ (මාත්‍රා 3 +4) දෙතිතට බෙර/දවුල් පද වාදනය<br>• 8 ශ්‍රේණියේ සිට ඉගෙන ගත් බෙර පද වාදනය | විවිධ තිත් රූපවලට බෙර පද වාදනය කරයි. | 04 |
| 4.0 ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා සබැඳි ගායනවල පසුබිම අධ්‍යයනය කරමින් ගායන කුසලතා ප්‍රදර්ශනය කරයි. | 4.1 ගායන හා සබැඳි සංස්කෘතික පසුබිම විස්තර කරයි. | •හටන් කවි, මෝල්ගස් කවි<br>• ග්‍රහ පන්ති, ප්‍රශස්ති, පන්තේරු කවි සහ වන්නම් | ගායන හා සබැඳි සංස්කෘතික හා සමාජයීය වටිනාකම් විස්තර කරයි. | 06 |
| | 4.2 නියමිත නාදමාලාව අනුගමනය කරමින් ගායන ඉදිරිපත් කරයි. | • හටන් කවි, මෝල්ගස් කවි<br>• ග්‍රහ පන්ති, ප්‍රශස්ති, පන්තේරු කවි සහ වන්නම් | නියමිත නාද මාලා අනුගමනය කරමින් විවිධ ගායන අංග ඉදිරිපත් කරයි. | 06 |

11 ශ්‍රේණිය නර්තන විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 5.0 ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුමය රැකගැනීම සඳහා ක්‍රියාකරයි. | 5.1 ශ්‍රී ලාංකේය නර්තන කලාව හා සබැඳි ඓතිහාසික පසුබිම විග්‍රහ කරයි. | • දේශීය වන්නම් වල පසුබිම හා විකාශනය<br>• නර්තන කලාවේ නූතන ප්‍රවණතා (1970 පසුව) | ශ්‍රී ලාංකේය නර්තනය හා සබැඳි ඓතිහාසික පසුබිම විස්තර කරයි. | 06 |
| | 5.2 ශ්‍රී ලාංකේය නර්තන කලාවේ සාහිත්‍ය කලා පෝෂණය සඳහා දායක වූ පර්යේෂණාත්මක ලේඛන/ කෘති පිළිබඳ තොරතුරු විස්තර කරයි. | • උඩරට, පහතරට, සබරගමු සම්ප්‍රදායට අයත් ලේඛන/ කෘති හඳුනා ගැනීම<br>- මහාචාර්ය, මුදියන්සේ දිසානායක<br>- මහාචාර්ය, ජයසේන කෝට්ටගොඩ<br>- මහාචාර්ය, තිස්ස කාරියවසම්<br>- ආචාර්ය, ශ්‍රියානි රාජපක්ෂ | දේශිය නර්තන සම්ප්‍රදායන්ට අයත් ලේඛන/ කෘති හඳුනා ගනිමින් තොරතුරු ඉදිරිපත් කරයි. | 02 |
| | 5.3 ශ්‍රී ලාංකේය ගැමි නාටක හා සබැඳි පසුබිම අධ්‍යයනය කර සුවිශේෂ ලක්ෂණ ඉදිරිපත් කරයි. | •කෝලම් නාටකය | ශ්‍රී ලාංකේය ගැමි නාටකවල සුවිශේෂ ලක්ෂණ අධ්‍යයනය කර තොරතුරු ඉදිරිපත් කරයි. | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 6.0 රසඥතා වර්ධනය සඳහා විවිධ කලාංගවල සුවිශේෂ ලක්ෂණ විචාරයට ලක් කරයි. | 6.1 රූපවාහිනි නාලිකාවල විකාශය වන නර්තන අංග විචාරයට ලක් කරයි. | • රූපවාහිනි නාලිකාවල විකාශය වන අධ්‍යයතන නර්තන වැඩසටහන් | ශ්‍රී ලංකාවේ රූපවාහිනියේ විකාශය වන නර්තන අංග නරඹා එහි කලාත්මක වටිනාකම් විචාරය කරයි. | 02 |
| | 6.2 වෙනත් සංස්කෘතියකට අයත් නර්තන සම්ප්‍රදායන් අධ්‍යයනය කරමින් තොරතුරු ඉදිරිපත් කරයි. | • මනිපුරි නර්තන සම්ප්‍රදාය ප්‍රචලිත ප්‍රදේශ, සංගීතය, වාද්‍ය භාණ්ඩ, නර්තන අංග, රංග වස්ත්‍රාභරණ සහ අංග රචනය | භාරතීය නර්තන සම්ප්‍රදායෙහි සංස්කෘතික, සමාජයීය හා කලාත්මක වටිනාකම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි. | 04 |
| 7.0 විවිධ අත්දැකීම් ඇසුරු කර ගනිමින් ප්‍රාසංගික කලාංග නිර්මාණ කරයි. | 7.1 ප්‍රාසංගික නර්තන අංගයක් නිර්මාණ කරයි. | • විජයතුමා තම්මැන්නේ / වාසනා දිනේකි මේක ගීතයට නර්තන නිර්මාණය | ගීතයක පසුබිම අධ්‍යයනය කර ප්‍රාසංගික නර්තන අංගයක් නිර්මාණ කරයි. | 04 |
| | 7.2 ප්‍රාසංගික ලක්ෂණ ප්‍රදර්ශනය වන පරිදි අංග රචනය කරයි. | •නර්තන අංගයක් සඳහා අංග රචනය | අංග රචනයේ සුවිශේෂතා අධ්‍යයනය කරමින් නර්තන අංගයක් සඳහා අංග රචනය කරයි. | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 8.0 නර්තන කලාවෙන් ලැබෙන මානසික හා ශාරීරික සුව සම්පත සාර්ථක දිවි පෙවෙතක් ගතකිරීමට ඉවහල් කර ගනියි. | 8.1 නර්තන කලාව හැදෑරීමෙන් අත්පත් කරගත් පුද්ගල වටිනාකම් අගයමින් විස්තර කරයි. | • රසඥතා වර්ධනය<br>• සාර්ථක දිවිපෙවෙතක් ගත කිරීමට | නර්තන කලාව හැදෑරීමේ වැදගත්කම හඳුනාගනිමින් සාර්ථක දිවිපෙවෙතක් ගත කිරීම සඳහා ඒවා භාවිතයට ගත හැකි අයුරු විමසයි. | 03 |
| | 8.2 නර්තන කලාව හැදෑරීමෙන් අත්පත් කර ගන්නා සමාජයීය වටිනාකම් පිළිබඳ අදහස් දක්වයි. | • සහජීවනය හා නායකත්ව ගුණාංග<br>• අන්තර්ජාතික සබඳතා<br>• සමාජ සම්බන්ධතා<br>• වේදිකා ප්‍රසංග | නර්තන කලාව හැදෑරීමෙන් අත්පත් කර ගන්නා සමාජයීය වටිනාකම් අගයමින් තොරතුරු ඉදිරිපත් කරයි. | 04 |
| | | | | 86 |

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

## I වාරය

| ක්‍රියාකාරකම් අංක | | කාලච්ඡේද |
|---|---|---|
| 2.2.1 | සාම්ප්‍රදායික වන්නම් නටමු. | 04 |
| 4.1. | ජන ගායනවල සමාජ, සංස්කෘතික පසුබිම හඳුනා ගනිමු. | 02 |
| 4.2. | නියමිත නාද මාලාව අනුගමනය කරමින් ගායන ඉදිරිපත් කරමු. | 02 |
| 1.1 | 'ශාන්ත'නැමති ස්ථායි භාවය නිරූපණය කරමු. | 03 |
| 2.1 | 1 සිට 12 දක්වා ගොඩසරඹ/ඉලංගම් සරඹ/දොඹින පද ප්‍රදර්ශනය කරමු. | 05 |
| 2.3.1 | තුන් තිතේ ප්‍රභේද දක්වමු | 01 |
| 5.1.1 | වන්නම්වල පසුබිම හා විකාශනය අධ්‍යයනය කරමු. | 03 |
| 5.3 | කෝලම් නාටක පිළිබඳ තොරතුරු අධ්‍යයනය කරමු. | 03 |
| 6.1 | රූපවාහිනී නාලිකාවල විකාශය වන අද්‍යතන නර්තන වැඩසටහන් අගයමු. | 02 |
| | | 25 |

## II වාරය

| | | |
|---|---|---|
| 2.2.1 | වන්නම් නර්තනය කරමු. | 03 |
| 4.1 | ජන ගායනවල සමාජ, සංස්කෘතික පසුබිම හඳුනා ගනිමු. | 02 |
| 4.2 | නියමිත නාද මාලාව අනුගමනය කරමින් ගායන ඉදිරිපත් කරමු. | 02 |
| 1.2 | විවිධ චරිත නිරූපණය කරමු. | 04 |
| 1.3 | කඩු/මෝල්ගස් නැටුමක් නිර්මාණය කරමු. | 05 |
| 2.2.2 | කුදාංත ගතදොං වට්ටම /ගුඳගතිගත වට්ටම/පට්ටුතල් මාත්‍රය නර්තන අංග ප්‍රදර්ශනය කරමු. | 03 |
| 3.1 | බෙර සරඹ වාදනය කරමු. | 02 |
| 3.2 | බෙර පද වයමු. | 04 |
| 5.1.2 | නර්තන කලාවේ නූතන ප්‍රවණතා අධ්‍යයනය කරමු. | 03 |
| 7.2 | නර්තන අංගයන් සඳහා අංග රචනය කරමු. | 03 |
| | | 31 |

## III වාරය

| | | |
|---|---|---|
| 4.1 | ජන ගායනවල සමාජ, සංස්කෘතික පසුබිම හඳුනා ගනිමු | 02 |
| 4.2 | නියමිත නාද මාලාව අනුගමනය කරමින් ගායන ඉදිරිපත් කරමු. | 02 |
| 2.3.2 | වන්නම් හා නර්තනය හා සබැඳි කවි ප්‍රස්තාර කරමු. | 02 |
| 2.4 | රස හා භාව හඳුනා ගනිමු. | 02 |
| 2.5 | ගැමි නැටුම් පිළිබඳ විමසමු. | 02 |
| 2.6 | කලාවන් හඳුනා ගනිමු. | 03 |
| 5.2 | පර්යේෂණාත්මක ලේඛන/කෘති පිළිබඳ තොරතුරු අධ්‍යයනය කරමු. | 02 |
| 7.1 | ගීතයට අනුව නර්තන නිර්මාණය කරමු. | 04 |
| 6.2 | මනිපූරි නර්තන සම්ප්‍රදාය පිළිබඳ තොරතුරු රැස් කරමු. | 04 |
| 8.1 | නර්තන කලාව හැදෑරීමේ වටිනාකම අගයමු. | 03 |
| 8.2. | නර්තන කලාවේ සමාජයීය වටිනාකම අගයමු. | 04 |
| | | 30 |

**නිපුණතාව 1.0** : පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කර ගනිමින් නර්තන නිර්මාණ කරයි.

**නිපුණතා මට්ටම 1.1** : භාව ප්‍රකාශවන පරිදි චරිත නිරූපණය කරයි.

**ක්‍රියාකාරකම 1.1** : 'ශාන්ත'නැමති ස්ථායි භාවය නිරූපණය කරමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03

**ඉගෙනුම් පල** :

- 'ශාන්ත' නමැති ස්ථායි භාවය ප්‍රකාශ කළ යුතු ආකාරය පිළිබඳ අදහස් දක්වයි.
- 'ශාන්ත' නමැති ස්ථායි භාවය ප්‍රකාශ කිරීමට සුදුසු සිද්ධියක් ගොඩ නගයි.
- 'ශාන්ත' නමැති ස්ථායි භාවය ප්‍රකාශ කිරීමට උචිත චලන නිර්මාණය කරයි.
- එම චලන උපයෝගි කර ගනිමින් චරිත නිරූපණය කරයි.
- භාව ප්‍රකාශනය තුළින් චරිත ස්වභාවය තීව්‍ර කර දක්වයි.

**ගුණාත්මක යෙදවුම්** : පින්තූර, D.V.D

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** :

පියවර 1
- සුදුසු ප්‍රවේශයක් භාවිත කරමින් 'ශාන්ත' නමැති ස්ථායි භාවය ප්‍රදර්ශනය කිරීම හා ඒ පිළිබඳ සාකච්ඡා කිරීම.

පියවර 2
- 'ශාන්ත' නමැති භාවය ප්‍රකාශ කිරීමට සුදුසු සිද්ධියක් ගොඩ නැගීමට අවස්ථාව ලබාදීම.

පියවර 3
- ඒ අතරින් සිද්ධියක් තෝරා ගෙන ශාන්ත නමැති ස්ථායි භාවය නිරූපණය කිරීමට මඟ පෙන්වීම.

පියවර 4
- ශිෂ්‍යයින්ට තම නිරූපණ ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දී ඒ පිළිබඳ විචාරාත්මක ව සාකච්ඡා කර තවදුරටත් එම නිරූපණ සංවර්ධනය කරගැනීමට උපදෙස් ලබාදීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

- 'ශාන්ත' නමැති ස්ථායි භාවයෙන් උපදින රසය කුමක් ද ?
- 'ශාන්ත' නමැති ස්ථායි භාවය නිරූපණය කිරීමට සුදුසු සිද්ධියක් නිර්මාණය කර එය නිරූපණය කරන්න.

**නිපුණතාව 1.0** : පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කර ගනිමින් නර්තන නිර්මාණ කරයි.

**නිපුණතා මට්ටම 1.2** : තේමාවක් අනුව චරිත නිරූපණය කරයි.

**ක්‍රියාකාරකම 1.2** : විවිධ චරිත නිරූපණය කරමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 04

**ඉගෙනුම් පල** :
- චරිත නිරූපණයට සුදුසු සිද්ධියක් ගොඩ නගයි.
- නර්තන මාධ්‍ය කොටගෙන චරිත නිරූපණය කරයි.
- විවිධ භාව ප්‍රකාශවන පරිදි චරිත නිරූපණයේ යෙදෙයි.
- තේමාවක් අනුව චරිත නිරූපණයේ යෙදෙයි.

**ගුණාත්මක යෙදවුම්** : බෙර, තාලම්පට

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** :

පියවර 1
- චරිත නිරූපණයට සුදුසු තේමාවක් ගොඩනැගීමට සාකච්ඡාවක් මෙහෙයවීම. සුදුසු තේමාවක් ගොඩ නැගීමට අවස්ථාව ලබාදීම.

පියවර 2
- ගොඩ නගන ලද තේමා ඇසුරින් සුදුසු නිර්මාණයක් තෝරා ගෙන නර්තන මාධ්‍ය කොට ගෙන චරිත නිරූපණය කරන ආකාරය සාකච්ඡා කිරීම. චරිත නිරූපණයේ දී භාව ප්‍රකාශනය දැක්වීමේ අවශ්‍යතාව හඳුන්වා දීම.

පියවර 3
- තේමාවට අනුව චරිත නිරූපණය කිරීමට අවස්ථාව ලබාදීම හා අභ්‍යාස කළ පසු එම නිර්මාණ ඉදිරිපත් කිරීමට සැලැස්වීම හා වාදනයෙන් සහාය වීම.

පියවර 4
- ඉදිරිපත් කළ නිර්මාණ පිළිබඳ ව සමාලෝචනය කිරීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :
- භාව ප්‍රකාශවන පරිදි චරිත නිරූපණය කිරීමට සුදුසු සිද්ධියක් ගොඩ නඟන්න.
- ගොඩ නගන ලද සිද්ධියට අනුව චරිත නිරූපණය කරන්න.
- චරිත නිරූපණයේ දී අවධානය කළ යුතු කරුණු ගොනු කරන්න.

**නිපුණතාව 1.0** : පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කර ගනිමින් නර්තන නිර්මාණ කරයි.

**නිපුණතා මට්ටම 1.3** : ගැමි නැටුම් හා සබැඳි සුවිශේෂ ලක්ෂණ හඳුනා ගනිමින් නර්තන නිර්මාණ කරයි.

**ක්‍රියාකාරකම 1.3** : කඩු/මෝල්ගස් නැටුමක් නිර්මාණය කරමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 05

**ඉගෙනුම් පල** :

- කඩු /මෝල්ගස් නැටුමේ සුවිශේෂ ලක්ෂණ හඳුන්වයි.
- කඩු/මෝල්ගස් නැටුමට උචිත චලන නිර්මාණය කරයි.
- රංග උපකරණ නිවැරදි ව හසුරුවමින් නර්තන ඉදිරිපත් කරයි.
- කඩු මෝල්ගස් නර්තන නිර්මාණ පිළිබඳ විචාරාත්මක ව අදහස් දක්වයි.

**ගුණාත්මක යෙදවුම්** : බෙර, තාලම්පට, කඩු /මෝල්ගස්

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** :

පියවර 1
- ඉගෙන ගන්නා ලද කඩු/මෝල්ගස් නැටුමේ කවියක් ගායනය කිරීමට සලස්වා එහි සුවිශේෂ ලක්ෂණ සාකච්ඡා කිරීම.

පියවර 2
- පන්තියේ සිටින ශිෂ්‍යයින් සංඛ්‍යාව අනුව කණ්ඩායම් කර කඩු/මෝල්ගස් නැටුම නිර්මාණය කිරීමට මඟ පෙන්වීම.

පියවර 3
- කඩු / මෝල්ගස් නැටුම ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදීම. එම නිර්මාණ පිළිබඳ ශිෂ්‍ය අදහස් විමසීම හා ඒ පිළිබඳ ඇගයීමට ලක්කර සාකච්ඡා කිරීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

- කඩු/මෝල්ගස් නැටුමෙ හි සුවිශේෂ ලක්ෂණ තුනක් විස්තර කරන්න.
- කඩු/මෝල්ගස් නැටුමක් නිර්මාණය කර ඉදිරිපත් කරන්න.

**නිපුණතාව 2.0** : නර්තන හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 2.1** : නිවැරදි අංගහාර ප්‍රදර්ශනය කරමින් සරඹ ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම 2.1** : 1 සිට 12 දක්වා ගොඩ සරඹ/ඉලංගම් සරඹ/දොඹින පද ප්‍රදර්ශනය කරමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 05

**ඉගෙනුම් පල** :

- ගොඩ සරඹ/ඉලංගම් සරඹ/දොඹින පද නියමිත අංගහාර අනුගමනය කරමින් ප්‍රදර්ශනය කරයි.
- ගොඩ සරඹ/ඉලංගම් සරඹ/දොඹින පද හා සබැඳි කස්තිරම් /ඉරට්ටි /හමාර පදය ඉදිරිපත් කරයි.
- නියමිත අංගහාර අනුගමනය කරමින් බෙර වාදනයට අනුව 1 සිට 12 දක්වා ගොඩ සරඹ /ඉලංගම් සරඹ/දොඹින පද ප්‍රදර්ශනය කරයි.

**ගුණාත්මක යෙදවුම්** : බෙරය/තාලම්පට

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** : 6 ශ්‍රේණියේ සිට 10 වන ශ්‍රේණිය දක්වා උගත් ගොඩ සරඹ /ඉලංගම් සරඹ/ දොඹින පද නැවත 1 සිට 12 දක්වා අනුපිළිවෙළින් ඉදිරිපත් කිරීමේ හැකියාව ඇත්දැයි නිරීක්ෂණය කිරීම අත්‍යවශ්‍ය වේ.

පියවර 1
- 6 ශ්‍රේණියේ සිට 10 වන ශ්‍රේණිය දක්වා ඉගෙන ගන්නා ලද ගොඩ සරඹ /ඉලංගම් සරඹ/දොඹින පද හා සබැඳි තොරතුරු පිළිබඳ විමසීම.

පියවර 2
- බෙර වාදනයට අනුව ගොඩ සරඹ/ඉලංගම් සරඹ/දොඹින පද 12 කස්තිරම් / ඉරට්ටි/හමාරපදය ප්‍රදර්ශනය කිරීමට අවස්ථාව ලබාදීම.

පියවර 3
- ශිෂ්‍යයින්ගේ ඉදිරිපත් කිරීම් විමර්ශනය කරමින් අවශ්‍ය මග පෙන්වීම් ලබා දී අභ්‍යාසවල නිරත කරවීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

- 6 සිට 10 දක්වා ඇගයීමට ලක්වුණු මෙම ක්‍රියාකාරකම හා සම්බන්ධ සරඹ නැවත ඇගයීමේ දී ආසන්න ප්‍රවීණතා මට්ටමට ලගා වී ඇත්දැයි සලකා බැලිය යුතු ය.
- 1 සිට 12 දක්වා ගොඩ සරඹ /ඉලංගම්සරඹ / දොඹින පද ප්‍රදර්ශනය කරන්න.

**නිපුණතාව 2.0** : නර්තන හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 2.2** : ශිල්පීය විධික්‍රම අනුගමනය කරමින් සාම්ප්‍රදායික නර්තන අංග ප්‍රදර්ශනය කරයි.

**ක්‍රියාකාරකම 2.2.1** : සාම්ප්‍රදායික වන්නම් නටමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 07

**ඉගෙනුම් පල** :

- 6 - 10 ශ්‍රේණි දක්වා උගත් වන්නම් නියමිත අංගහාර සහිතව ප්‍රදර්ශනය කරයි.
- මුසලඩි වන්නම /ශුද්ධ තාලය සින්දුවන්නම/කොවුලා වන්නම සම්පූර්ණ කොටස් සහිත ව නර්තනය කරයි.
- ගායනය කරමින් කණ්ඩායම් වශයෙන් නර්තන අංග ඉදිරිපත් කරයි.
- බෙර වාදනයට අනුව නියමිත අංගහාර සහිත ව නර්තන අංග ඉදිරිපත් කරයි.

**ගුණාත්මක යෙදවුම්** : බෙරය/තාලම්පට, පද කොටස් ලියන ලද සටහන්

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** : 6 - 10 ශ්‍රේණිය දක්වා ඉගෙනගත් වන්නම් පළමු වාරයේ දී ගායනය සහිත ව අභ්‍යාස කිරීමට යොමු කර 11 ශ්‍රේණියට අයත් වන්නම් දෙවෙනි වාරයේ දී නර්තනය කිරීමට අවශ්‍ය උපදෙස් ලබාදෙන්න.

පියවර 1
- මුසලඩි වන්නම /ශුද්ධතාලය සින්දුවන්නම/කොවුලා වන්නමට අයත් කවියක පද කොටසක් ගායන කර එහි සුවිශේෂතා විස්තර කිරීම.

පියවර 2
- වන්නමට අදාළ පද (මාත්‍රා) නර්තනය කරන අයුරු විස්තර කිරීම හා ඒ සඳහා ශිෂ්‍යයින් යොමුකිරීම.

පියවර 3
- සියලු ම පද කොටස් නර්තනය කළ පසු කස්තිරම,සීරුමාරුව, අඩව්ව/ඉරට්ටිය/කලාසම හා අඩව්ව නර්තනය කරන අයුරු ප්‍රදර්ශනය කර අවශ්‍ය උපදෙස් ලබාදීම.

පියවර 4
- වන්නම ගායනය කරමින් බෙර වාදනයට අනුව නියමිත අංගහාර සහිත ව නර්තන කිරීමට යොමු කිරීම.

පියවර 5
- කණ්ඩායම් වශයෙන් නර්තන අංග ඉදිරිපත් කිරීමට සලස්වා ඒ පිළිබඳ සමාලෝචනයක යෙදීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

- 6,10 ශ්‍රේණිය දක්වා ඉගෙන ගත් වන්නම් කණ්ඩායම් වශයෙන් ඉදිරිපත් කරන්න.
- මුසලඩි වන්නම /ශුද්ධතාලය සින්දුවන්නම/කොවුලා වන්නම ගායනය කරමින් කණ්ඩායම් වශයෙන් /ඒකල ව ඉදිරිපත් කරන්න.

## උඩරට සම්ප්‍රදාය මුසලඩි වන්නම

මාත්‍රා 3 + 4 දෙතිත හා මාත්‍රා 3 තනිතිත

| | |
|---|---|
| බෙර පදය | දෝං ජිං ජිං තකට දොංතක /ජිංගත ගොගො |
| තානම | තානත්ත තනෙනත්ත තානම් - තම් ද<br>නානත්ත තනෙනත්ත තානම්<br><br>තනත් තනෙන තතන තනෙන<br>තානෙන තම්දාන තනෙන<br><br>තා නත්ත තනෙනත්ත තානම් - තම්ද<br>නා නත්ත තනෙනත්ත තානම් |
| කවිය | වන පැත්ත බිය පත්ව සයනම්<br>දුටත් යනෙන විටත් දුවන<br>පිටත් පොට ගසා පනිමින<br>නැත නාඩි ඉඳවාඩි වෙව්ළුම්<br><br>නොනැවත යනු නැත එතනින්<br>හිරුත් අවර ගිරත් පැමිණි<br>කලත් වසන තැනින් දුවන<br>පැන ආඩි පත්රාසි බුදිමින්<br><br>සිරිගත්ත සඳුපත්ව මුදුනින්<br>විටත් ඔවුන තුටත් සිතින<br>මහත් සමඟියෙන් දුව පැන<br>උණු දැඩි වනවාඩි ලන්නම්<br><br>මේ ඇත්තමයි සත්ත කියනෙම්<br>ගමනක් යන විලසක් ගෙන<br>ඉසිදුන් දෙවි කළ සතොසින<br>කර දැඩි මුසලාඩි වන්නම් |

කස්තිරම -

රැඳග ජිත්තක තකට කුංදත්
තග්ග ජිත්තක තකට කුංදත්
රැඳග ජිංජිං රැදග ජිංජිං
රැඳග ජිංතක තකට කුංදත්
ජිං තත් තත් ජිං කුඳ කුඳ //////
රැඳග ජිත්තක තකට කුංදත්
තග්ග ජිත්තක තකට කුංදත්
රැඳග ජිත්තක තකට කුංදත්
දෝං තා

සීරු මාරුව

තකුද තකුතක තකට කුංදත්
තග්ග ජිත්තක තකට කුදත්
තකුඳ තකු තක තකට කුංදත්
දෝං තා

අඩව්ව

තාකු තකුං තරිකිට තකුඳ තත්ජෙං
තත් ජෙං තජෙං තත් ජෙං
ජිකු ජික්කුං තරිකිට ජිකුඳ තත්ජෙං
තත් ජෙං තජෙං තත් ජෙං
තාකු තකුං තරිකිට තකුඳ තත්ජෙං
ජිකු ජික්කුං තරිකිට ජිකුඳ තත්ජෙං
තාකු තක්කුං තරිකිට
ජිකු ජික්කුං තරිකිට
තකුඳ තත්ජෙං ජෙංතා ජෙංතා
ජෙංත කුඳ ජෙංත තා

**පහතරට ශුද්ධ තාලය සින්දුවන්නම්**

තාලය - දෙසුළු මැදුම් තුන්තිත ( මාත්‍රා 2 + 2 + 3)

බෙර පදය - දිත්තම් දිතකු දොම් දොම් තා

තානම
තෙන තෙන තෙන ...........................
තෙනෙනම් තෙන ..............................
තෙන තෙනෙනා ...........ආ .............
නාතෙන තෙන .....................
තෙනෙනම් තෙන ......................
තෙන තෙනෙනා ............ආ ............

කවිය :-
සිරිපිරි ගිරි මුදුනත සුරපුර ලෙසිනා
සිරිලක පවර දෙවිනුවරෙහි වෙසෙසවනා
සිරිසඳ සමග සිරිසඳ සමගිව වෙසෙනා
සුරිඳුනි අසනු මකියන බස බැති පෙමිනා

ඉරට්ටිය :
තත් ගුඳගත දිත් දිත් තෙයි
ගත ගුඳගත දිත් දිත් තෙයි
තත් ගුඳගත ගත ගුඳගත
ගුඳගත් ගුඳගත තත් ගුඳගත
දිත් දිත් තෙයි

**කොවුලා වන්නම**

දවුල් පදය : දොංත තකට
දවුල් පදය : කුදත් තක්කිට තකට ජිම්තක

තානම -
තාන තනා තන තම්දෙනා - තෙතන තනා තන තම්දෙනා //
තාන තනා තම්දෙනා - තෙතන තනා තෙතන තනා තම්දෙනා

කවිය
කොහොව් යනා - හඬ නඟනා - මියුරු මනා දන සවනා //
පරපුටු වෙසෙසෙන්නේ වසන්තේ මහවන ගස් මුදුනේ.
රිටු විමනා - බිජු ලමිනා - බහු නදනා රකෙනු මෙගා //
ලොකු වී හද දෙන්නේ - ඔවුන්ගෙන් හැමවිට බැට කන්නේ
රුව සමනා - උගත් මනා - ඉසි වඩනා - රිටු නොමිනා //
රිටු පරපුටු හටනේ - දෙවන්නේ නිදසුන් යස රුවිනේ
ලොව දුදනා ගතිය මනා මෙම හටනා ලොව තිබෙනා
මදහුගෙ මිතුරන්ගේ ගයන්නේ මෙම මනහර වරුනේ

කලාසම :
කුද කුද ගත /// තතත් තා
කුදිත ගත ගත ගතිත කුද කුද //
කුදිත තත් කුද ගතිත ගත දොම්

අඩව්ව :
තාත් තජ්ජිත් තකට තත් ජිත්
කිනම් තත් ජිත් ගත කුදා
තකට තා
තත් කර කර ජිත් කර කර තක
දොංත ගත්තත් ගතත් කුද ගත තා
ගත්තත් ගතත් කුදගත තහර්ද තා

**නිපුණතාව 2.0** : නර්තන හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 2.2** : ශිල්පීය විධික්‍රම අනුගමනය කරමින් සාම්ප්‍රදායික නර්තන අංග ප්‍රදර්ශනය කරයි.

**ක්‍රියාකාරකම 2.2.2** : කුදාංත ගතදොං වට්ටම /ගුඳගතිගත වට්ටම/පට්ටුතල් මාත්‍රය නර්තන අංග ප්‍රදර්ශනය කරමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03

**ඉගෙනුම් පල** :

- කුදාංත ගතදොං වට්ටම/ගුඳගතිගත වට්ටම /පට්ටුතාල් මාත්‍රය තිත් රූපය නම් කරයි.
- අදාළ පද කොටස් තාල තබමින් කියයි.
- නියමිත අංගහාර අනුගමනය කරමින් කුදංත ගතදොං වට්ටම /ගුඳගතිගත වට්ටම/පට්ටුතල් මාත්‍රය ප්‍රදර්ශනය කරයි.

**ගුණාත්මක යෙදවුම්** : බෙර, තාලම්පට, පද කොටස් ලියූ සටහන්

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** :

- කුදාංත ගතදොං වට්ටමේ ආරම්භක පදය සමග මාත්‍රා පද දෙකක්, කස්තිරම් දෙකක් හා අඩව් දෙකක්/ගුඳගතිගත වට්ටමේ 3 සහ 4 මාත්‍රා දෙකක් ඉරට්ටි දෙකක් /පට්ටුතල් මාත්‍රයේ කලාසම් වට්ටම, කලාසම, අඩව්ව මෙහි විෂය අන්තර්ගතය වේ. අදාළ සම්ප්‍රදායවල කොටස් තෝරා ගන්න.

පියවර 1 • සම්ප්‍රදායට අදාළ පද කොටස් තාල තබමින් කියා තිත් රූපය හඳුනා ගැනීමට සැලැස්වීම.

පියවර 2 • අදාළ පද කොටස් ප්‍රදර්ශනය කර නර්තනයට යොමු කරවීම.

පියවර 3 • බෙර වාදනයට අනුව නියමිත අංගහාර සහිත ව නර්තන ඉදිරිපත් කිරීමට මඟ පෙන්වීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

- කුදාංත ගතදොං වට්ටම /ගුඳගතිගත වට්ටම/ පට්ටුතල් මාත්‍රය නර්තන අංගවල තිත් රූපය නම් කරන්න.
- කුදාංත ගතදොං වට්ටම/ගුඳගතිගත වට්ටම / පට්ටුතාල් මාත්‍රය නර්තන ඉදිරිපත් කරන්න.

## කුඳංත ගත දොං වට්ටම

උඩරට සම්ප්‍රදාය

| | | |
|---|---|---|
| තාල රූපය | : | මාත්‍රා 2 + 2 + 4 තුන්තිත (දෙසුළු මහ තුන්තිත) |
| **වට්ටම් පිරිම** | : | කුඳංත ගත කුඳ දොම්කිට තරිකිට කුංදත් තා |
| 1 පදය | : | කුඳංත ගත දොං |
| **කස්තිරම** | : | තත් ජිත් තොං නං තා |
| අඩව්ව | | තාං දොමිති ගත දොම්කිට කඩතක තරිකිට |
| | | කිතක දොමිති ගත කිත්තක් කුඳ කුඳ |
| | | තා කුජිත්ත ගත දොම්කිට තරිකිට කුංදත් තා |
| 2 පදය | : | කුඳංත ගත දොං |
| **කස්තිරම** | : | තත් ජිත් තක ජිත් තත් ජිත් තොංනං තා |
| අඩව්ව | : | තත් තොඟ තක තොඟ |
| | | තක්කඩ තරිකිට තක තොඟ |
| | | තකට ජිකට තොඟ ජික්කඩ තරිකිට තක තොඟ |
| | | තා කුජිත්ත ගත දොම්කිට තරිකිට කුංදත් තා |

## ගුඳගතිගත වට්ටම

| | | |
|---|---|---|
| තාලය | : | සුළු තනි තිත (මාත්‍රා 2 + 2) |
| 3 වන පදය | : | ගුඳ ගති ගත ගුඳ ගුඳ ගති ගත |
| අන්තාඩිය | : | ගුඳ ගති ගත ගුඳ ගත්තම් |
| ඉරට්ටිය | : | ගුංදත් ගුහිතිගදිරිකිට ගත ගත /// ගහිති ගතම්<br>තත් දිත් තත් දිගතම් දොම් (ගති ගත) |
| තාලය | : | සුළු තනිතිත (මාත්‍රා 2 + 2) |
| 4 වන පදය | : | ගුඳ ගති ගත ගුඳ ගුඳ ගති ගත |
| අන්තාඩිය | : | ගුඳ ගති ගත ගුඳ ගත්තම් |
| ඉරට්ටිය | : | ගුංදත් ගුහිතිගදිරිකිට ගත ගත,<br>ගුහිතිගදිරිකිට ගත ගත,<br>ගුහිති ගදිරිකිට ගත ගත<br>ගහිතිගතම්, තත් දිත් තත් දිගතම්<br>දොම් (ගතිගත) |

**පට්ටුතාල මාත්‍රය**

**තාල රූපය :** මාත්‍රා 3+2+2 (2+2+3) තුන් තිතේ තාලය

**පදය :** කුඳත් තක්කිට තකට ජිමිතකු

**වට්ටම :** තහර් රූඳ දොං ගතිත ගතදොම් //

තහර් රූඳ දොං ///ගතිත ගතදොම් ///-//

තහර් රූඳ දොං ///ගතිත ගතදොම් //

**කලාසම :** කුඳිත ගත ගත ගතිත කුඳ කුඳ/// කුඳිත තත් කුඳ ගතිත කුඳ දොං

**අඩව්ව** තහර් ද තත් තත් තතත් තත්තත්

තහර් ද තත් කිට තකට කුඳ දොං

තහර් රූඳ දොං /// දොංත ගත්තත්

ගතත් කුඳගත තා ගත්තත් ගතත් කුඳ ගත තා

**නිපුණතාව 2.0** : නර්තන හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 2.3** : ප්‍රස්තාරකරණයේ විධික්‍රම අනුගමනය කරයි.

**ක්‍රියාකාරකම 2.3.1** : තුන් තිතේ ප්‍රභේද දක්වමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 01

**ඉගෙනුම් පල** :
- තුන් තිතේ ප්‍රභේද විස්තර කරයි.
- තුන් තිතේ ප්‍රභේද අනුව තාල තබයි.
- තුන් තිතේ ප්‍රභේද අනුව තාල තබමින් පද කියයි.

**ගුණාත්මක යෙදවුම්** : තාලම්පට, බෙර පද ලියූ සටහන්

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** :

- තුන් තිතේ ප්‍රභේද හඳුන්වාදීම අපේක්ෂා කෙරේ. ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායන්වල නර්තන අංගවල තිත් ප්‍රභේද අධ්‍යයනය කිරීමට යොමු කරවීම.

පියවර 1 • තුන් තිතේ ප්‍රභේද පිළිබඳ ව ශිෂ්‍යයින් සමඟ සාකච්ඡා කිරීම.

පියවර 2 • තුන් තිතේ ප්‍රභේද අනුව තාල තබමින් පද කියා ප්‍රායෝගික ව ඒ පිළිබඳ අවබෝධ කරවීම.

පියවර 3 • තුන් තිතේ ප්‍රභේදවලට අයත් විවිධ පද කීමට යොමු කරවීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

- තුන් තිතේ ප්‍රභේද හඳුන්වන්න.
- තුන්තිතේ ප්‍රභේදවලට අයත් පද තාල තබමින් කියන්න.

**නිපුණතාව 2.0** : නර්තන හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 2.3** : ප්‍රස්තාරකරණයේ දී විධික්‍රම අනුගමනය කරයි.

**ක්‍රියාකාරකම 2.3.2** : වන්නම් හා නර්තනය හා සබැඳි කවි ප්‍රස්තාර කරමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :
- කඩු නර්තනය හා සබැඳි කවි ප්‍රස්තාර කරයි.
- මෝල්ගස් කවි ප්‍රස්තාර කරයි.
- ග්‍රහපන්ති කවි ප්‍රස්තාර කරයි.
- වන්නම් ප්‍රස්තාර කරයි.
- වට්ටම් /පට්ටුතල් මාත්‍රය ප්‍රස්තාර කරයි.

**ගුණාත්මක යෙදවුම්** : කවි ලියූ සටහන් පත්‍රිකා, බෙරය, තාලම්පට

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** :

- ඉගෙන ගන්නා ලද නර්තනාංග හා සබැඳි කවි සියල්ල ප්‍රස්තාර කිරීමට යොමු කරවන්න.

පියවර 1
- අදාළ කොටස් ගායනයට යොමුකරවීම හා තාල තබමින් කීම. තාල පිළිබඳ ව  අවබෝධය ලැබුණු පසු ප්‍රස්තාරකරණයේ යෙදවීම.

පියවර 2
- කරන ලද ප්‍රස්තාර විමසා බලමින් අඩුපාඩු සකස්කර නැවත ප්‍රස්තාරකරණයේ යෙදීමට මග පෙන්වීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

- කඩු නැටුමේ කවි දෙකක්  ප්‍රස්තාර කරන්න.
- මෝල්ගස් නැටුමේ කවි දෙකක් හා ග්‍රහ පන්ති කවියක් ප්‍රස්තාර කරන්න.
- ඉගෙන ගන්නා ලද වන්නමක් ප්‍රස්තාර කරන්න.
- ගුදගතිගත වට්ටම/කුදංත ගතදොං වට්ටම /පට්ටුතල් මාත්‍රය ප්‍රස්තාර කරන්න.

**නිපුණතාව 2.0** : නර්තන හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 2.4** : රස හා භාව විස්තර කරයි.

**ක්‍රියාකාරකම 2.4.** : රස හා භාව හඳුනා ගනිමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :
- නව නළු රස නම් කරයි.
- භාව නවය නම් කරයි.
- රස හා භාව හඳුනා ගනිමින් ඒ පිළිබඳ අදහස් ඉදිරිපත් කරයි.
- භාව නිරූපණය කිරීමේ දී මුහුණේ ඉරියව්වල වෙනස්කම් විස්තර කරයි.

**ගුණාත්මක යෙදවුම්** : V.C.D හා පින්තූර

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** : රස හා භාව හඳුනා ගැනීමට ශිෂ්‍ය ක්‍රියාකාරකම් උදාහරණයට ගත හැකිය.

පියවර 1
- ඉගෙන ගන්නා ලද භාව ප්‍රකාශන ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා රස භාව හැඳින්වීම.

පියවර 2
- රස හා භාව හැඳින්වීම හා ඒ පිළිබඳ සාකච්ඡා කිරීම, අවශ්‍ය කොටස් සටහන් කර ගැනීමට සැලැස්වීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :
- නව නළු රස නම් කරන්න.
- භාවයන් දෙකක වෙනස්කම් විස්තර කරන්න.

**නිපුණතාව 2.0** : නර්තන හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 2.5** : සිංහල හා දෙමළ ගැමි නැටුම් පිළිබඳ තුලනාත්මක ව කරුණු දක්වයි.

**ක්‍රියාකාරකම 2.5** : ගැමි නැටුම් පිළිබඳ විමසමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :
- සිංහල හා දෙමළ ගැමි නැටුම් පිළිබඳ සංස්කෘතික පසුබිම විස්තර කරයි.
- සිංහල හා දෙමළ ගැමි නැටුම් පිළිබඳ තුළනාත්මක ලක්ෂණ විස්තර කරයි.

**ගුණාත්මක යෙදවුම්** : සිංහල හා දෙමළ ගැමි නැටුම් ඇතුළත් D.V.D පට හා පින්තූර

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** :

පියවර 1
- සිංහල හා දෙමළ ගැමි නැටුම් භාවිත වන අවස්ථා පිළිබඳ සාකච්ඡා කිරීම.

පියවර 2
- මෙම ගැමි නැටුම්වල ගායන, වාදන, රංග වස්ත්‍රාභරණ, රංග උපකරණ පිළිබඳ තුලනාත්මක ව සාකච්ඡා කිරීම හා අවශ්‍ය සටහන් තබා ගැනීමට සැලැස්වීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :
- සිංහල හා දෙමළ ගැමි නර්තනාංග නම් කරන්න.
- එම නර්තන අංග භාවිත වන අවස්ථා විස්තර කරන්න.
- සිංහල හා දෙමළ ගැමි නැටුම් පිළිබඳ තුලනාත්මක ව කරුණු දක්වන්න.

**නිපුණතාව 2.0** : නර්තන හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 2.6** : නර්තන කලාව හා අනෙකුත් කලාවන් අතර සහසම්බන්ධතාව විමසුමට ලක් කරයි.

**ක්‍රියාකාරකම 2.6** : චිත්‍ර/සංගීත/නාට්‍ය/නර්තන කලා හඳුනා ගනිමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03

**ඉගෙනුම් පල** :

- චිත්‍ර/සංගීත/නාට්‍ය/නර්තන කලා යනු කුමක්දැයි හඳුන්වයි.
- චිත්‍ර/සංගීත/නාට්‍ය/නර්තනකලා අතර පවතින අන්‍යෝන්‍ය සම්බන්ධතාව විස්තර කරයි.
- චිත්‍ර/සංගීත/නාට්‍ය/නර්තනකලා ඉදිරිපත් කිරීමේ ක්‍රම විධි සාකච්ඡා කරයි.
- දේශීය චිත්‍ර/සංගීත/නාට්‍ය/නර්තන කලා අංගයක් උදාහරණයට ගෙන තොරතුරු ඉදිරිපත් කරයි.

**ගුණාත්මක යෙදවුම්** : පුවත්පත්, ලිපි ලේඛන, V.C.D තැටි, හඬ තැටි, පින්තූර

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** :

- පියවර 1 • චිත්‍ර/සංගීත/නාට්‍ය/නර්තන අංගයක් ප්‍රදර්ශනය කරමින් එහි සුවිශේෂතා අධ්‍යයනය කිරීමට යොමු කිරීම හා ඒ පිළිබඳ සාකච්ඡා කිරීම.
- පියවර 2 • චිත්‍ර/සංගීත/නාට්‍ය/නර්තන කලා අංගවල දක්නට ලැබෙන සන්නිවේදන ලක්ෂණ සාකච්ඡා කිරීම.
- පියවර 3 • එක් ශිෂ්‍ය කණ්ඩායමක් ගීත ගායනයට ද අනෙක් කණ්ඩායම ගීතයට අනුව නර්තනය කිරීමටද සැලැස්වීම.
- පියවර 4 • එම අංගවල සුවිශේෂතා අධ්‍යයනය කිරීමට යොමුකර ශිෂ්‍ය අදහස් විමසීම.
- පියවර 5 • චිත්‍ර/නර්තන/සංගීත/නාට්‍ය අංගයන් හි පවත්නා තුලනාත්මක ලක්ෂණ සාකච්ඡා කිරීම.
- පියවර 6 සාකච්ඡා කරන ලද කරුණු ඇසුරු කර ගනිමින් සමාලෝචනයක් කිරීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

- චිත්‍ර/සංගීත/නාට්‍ය/නර්තන කලා යනු කුමක්දැයි හඳුන්වන්න.
- චිත්‍ර/සංගීත/නාට්‍ය/නර්තන කලා දෙකක සමාන අසමාන ලක්ෂණ දක්වන්න.
- චිත්‍ර/සංගීත/නාට්‍ය/නර්තන කලාවන් ගේ සුවිශේෂ ලක්ෂණ පහක් ලියන්න.

**කාර්යය පත්‍රිකාව   වගුව සම්පූර්ණ කරන්න.**

| ඒකකය | නර්තන | සංගීත | නාට්‍ය | චිත්‍ර |
|---|---|---|---|---|
| ප්‍රධාන මාධ්‍ය | | | | |
| සුවිශේෂ ලක්ෂණ | | | | |
| භාවිත වන අවස්ථා | | | | |
| සන්නිවේදනය සඳහා භාවිතයට ගන්නා විධික්‍රම | | | | |
| එක් එක් කලාංග අතර ඇති සම්බන්ධතාව | | | | |

නර්තන අංගයක් උදාහරණයට ගෙන අනෙකුත් කලා අංග ඊට සම්බන්ධ වී ඇති අයුරු විමසන්න.

**නිපුණතාව 3.0** : සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ හඳුනා ගනිමින් වාදන කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 3.1** : බෙර වාදනය හා සබැඳි මූලික සරඹ වාදනය කරයි.

**ක්‍රියාකාරකම 3.1** : බෙර සරඹ වාදනය කරමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :

- බෙර සරඹ තාල තබමින් කියයි.
- බෙර සරඹ වාදනයේ දී අනුගමනය කළ යුතු ශිල්ප ක්‍රම හඳුන්වයි.
- ත්‍රිවිධ ලය අනුව සරඹ වාදනය කරයි.
- සාමූහික ව බෙර සරඹ වාදනය කිරීමෙන් සතුටක් ලබයි.

**ගුණාත්මක යෙදවුම්** : බෙර සරඹ ලියන ලද පුවරු, පින්තූර, තාලම්පට, බෙර

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** :

පියවර 1 :
- බෙර පදයක් වාදනය කර එහි පද කොටස් විමසමින් සාකච්ඡාවක් මෙහෙයවීම.

පියවර 2 :
- බෙර සරඹ පද කොටස් ලියා දැක්වීම හෝ සටහන් තබන ලද පුවරු ප්‍රදර්ශනය කිරීම.

පියවර 3 :
- බෙර සරඹවල අක්ෂර වාදනය කරන අයුරු විස්තර කිරීම හා ඒ සඳහා සිසුන් යොමු කිරීම.
- නියමිත අක්ෂර වාදනයට අවශ්‍ය උපදෙස් ලබාදෙමින් අභ්‍යාසයේ යෙදවීම.

පියවර 4

කණ්ඩායම් වශයෙන් වාදන ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දී බෙර සරඹ වාදනයේ දී අනුගමනය කළ යුතු ශිල්පක්‍රම පිළිබඳ සමාලෝචනයක යෙදීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

- බෙර සරඹ තාල තබා කියන්න.
- සරඹ වාදනයේ දී අනුගමනය කළ යුතු ශිල්පීය ක්‍රම විස්තර කරන්න.
- සාමූහික ව කණ්ඩායම් වශයෙන් බෙර සරඹ වාදනය කරන්න.

**නිපුණතාව 3.0** : සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ හඳුනා ගනිමින් වාදන කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 3.2** : නිවැරදි ශිල්පීය ක්‍රම අනුගමනය කරමින් බෙර වාදනය කරයි.

**ක්‍රියාකාරකම 3.2** : බෙර පද වයමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 04

**ඉගෙනුම් පල** :
- මැදුම් මහ දෙතිතට අයත් බෙර පද තාල තබා කියයි.
- මැදුම් මහ දෙතිතට බෙර පද වාදනය කරයි.
- 8 ශ්‍රේණියේ සිට ඉගෙනගත් බෙරපද අභ්‍යාස කරයි.
- සාමූහික ව බෙර වාදනය කරයි.
  බෙර වාදනය හා සබැඳි ශිල්පක්‍රම භාවිතයට ගනියි.
- බෙර වාදනය කිරීමෙන් සතුටක් ලබයි.

**ගුණාත්මක යෙදවුම්** : කාර්ය පත්‍රිකා, ඇමුණුම්, බෙර පද ලියන ලද සටහන්

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** : පාඩම ආරම්භ කිරීමට පෙර බෙර පද ලියන ලද සටහන් පත්‍ර හා ශිෂ්‍ය කාර්ය පත්‍රිකා සූදානම් කර ගන්න.

පියවර 1 :
- ශිෂ්‍යයන් ඉගෙනගත් විවිධ බෙර පද වාදනය කිරීමට අවස්ථා ලබා දීම.

පියවර 2 :
- මැදුම් මහ දෙතිතට අයත් බෙර පදයක් තාල තබා කීම හා වාදනය කරන අයුරු නිදර්ශන සහිත ව විස්තර කිරීම.

පියවර 3
- මැදුම් මහ දෙතිතට අයත් බෙර පදයක් වාදනය කිරීමට සැලැස්වීම හා අක්ෂර නිවැරදි ව වාදනය කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දීම.

පියවර 4 :
- ශිෂ්‍යයන් කණ්ඩායම් දෙකකට වෙන්කර එක් කණ්ඩායමක් තාල තබන විට අනෙක් කණ්ඩායම බෙර වාදනයට යොමු කිරීම. මෙලෙස කණ්ඩායම් හුවමාරු කරමින් ක්‍රියාකාරකමේ යෙදවීම.

පියවර 5 :
- ඉගෙන ගන්නා ලද බෙර පද ගුරුවරයා වාචික ව පවසන විට ශිෂ්‍යයන් එම පද වාදනයට යොමු කිරීම.
- බෙර පද අභ්‍යාස කිරීමට සලස්වා වාදන කුසලතා වර්ධනය කර ගැනීමට අවශ්‍ය උපදෙස් ලබා දීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :
- 8 ශ්‍රේණියේ සිට ඉගෙනගත් බෙර පද වාදනය කරන්න.
- මැදුම් මහ දෙතිතට අයත් බෙර පද වාදනය කරන්න.
- ගායනයට අනුව බෙර පදයක් වාදනය කරන්න.
- ලය පිහිටුවා ගනිමින් සාමූහික ව බෙර පදයක් වාදනය කරන්න.

**නිපුණතාව 4.0** : ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා සැබැඳි ගායනවල පසුබිම අධ්‍යයනය කරමින් ගායන කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 4.1** : ගායන හා සැබැඳි සංස්කෘතික පසුබිම විස්තර කරයි.

**ක්‍රියාකාරකම 4.1** : ජන ගායනවල සමාජ, සංස්කෘතික පසුබිම හඳුනා ගනිමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06 (එක් වාරයකට 02 බැගින්)

**ඉගෙනුම් පල** :

- නියමිත ගායනවල පසුබිම විස්තර කරයි.
- එම ගායනවල භාෂාත්මක විග්‍රහය, අනන්‍යතා ලක්ෂණ හා ගායන අවස්ථා පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- අදාළ ගායනවල තොරතුරු ඇසුරු කර ගනිමින් කුඩා පොතක් / සඟරාවක් සකස් කරයි.

**ගුණාත්මක යෙදවුම්** : පුවත්පත් ලිපි, ඇමුණුම් කාර්ය පත්‍රිකා

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** : මෙම නිපුණතා මට්ටමට අදාළ ක්‍රියාකාරකම් 03ක් දක්වා ඇත. එක් වාරයකට කාලච්ඡේද 02 බැගින් වන පරිදි විෂය අන්තර්ගතය සකස් කර ගත හැකි ය. ඒ අනුව ඔබට කැමති පරිදි පාඩම සැලසුම් කර ගත හැකි ය. (වාර සටහන බලන්න).

- ජන ගායන හා බැඳි තොරතුරු ඇසුරු කර ගනිමින් කුඩා පොතක් / සඟරාවක් සකස් කිරීම අවසාන වාරයට යොදා ගන්න.

පියවර 1 :

- ගායනවලට අදාළ කවි ශ්‍රවණයට සලස්වා ඒ පිළිබඳ තොරතුරු විමසීම. අදාළ ගායනවල සමාජ සංස්කෘතික පසුබිම පිළිබඳ තොරතුරු විමර්ශනයට අවස්ථාව ලබා දීම. මේ සඳහා හඬපටි, පුවත්පත් ලිපි, ලේඛන හෝ වෙනත් මූලාශ්‍ර සපයා ගත හැකි ය. (තොරතුරු සටහන් කිරීමට කාර්යය පත්‍රිකාවක් සකස්කර ගන්න). කාර්ය පත්‍රිකාව සම්පූර්ණ කිරීම සඳහා සිසුන් යොමු කිරීම.

පියවර 2 :

- ශිෂ්‍යයන් රැස්කළ තොරතුරු ඇසුරෙන් සාකච්ඡාවක් මෙහෙයවීම.

පියවර 3 :

- අදාළ ගායනවල සමාජ සංස්කෘතික වටිනාකම් පිළිබඳ විමසමින් සමාලෝචනයක් කිරීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

- නියමිත වාරයට අදාළ ගායනවල සමාජ සංස්කෘතික පසුබිම විස්තර කරන්න.
- එම ගායනවල අනන්‍යතා ලක්ෂණ, භාෂාත්මක විග්‍රහයන් හා ඖචිත්‍යභාවය පිළිබඳ ඇගයීමක් කරන්න.
- ශිෂ්‍යයන් සකස් කළ කුඩා පොත/ සඟරාව පිළිබඳ ඇගයීමක් කරන්න. (අවසාන වාරයට).

**නිපුණතාව 4.0** : ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා සැබැඳි ගායනවල පසුබිම අධ්‍යයනය කරමින් ගායන කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 4.2** : නියමිත නාද මාලාව අනුගමනය කරමින් ගායන ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම 4.2** : නියමිත නාද මාලාව අනුගමනය කරමින් ගායන ඉදිරිපත් කරමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06 (වාරයකට 02 බැගින්)

**ඉගෙනුම් පල** :
- නියමිත නාදමාලාව අනුගමනය කරමින් ගායන අංග ඉදිරිපත් කරයි.
- බෙර වාදනයට අනුව තාලානුකූල ව ගායන අංග ඉදිරිපත් කරයි.
- ගායන අංග ප්‍රාසංගික ව ඉදිරිපත් කරයි.
- සාමූහික ව ගායන ඉදිරිපත් කිරීමෙන් සතුටක් ලබයි.

**ගුණාත්මක යෙදවුම්** : ගායනයට අදාළ කවි ලියන ලද සටහන්, හඬපටි/V.C.D තැටි

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** :
- ගායනය පිළිබඳ ප්‍රායෝගික ක්‍රියාකාරකම් සැලසුම් කිරීමේ දී එක් වාරයකට ගායන අංග 02ක් හා කාලච්ඡේද 02 බැගින් යොදා ගන්න. මෙහි සඳහන් පරිදි පාඩම් සටහන් සැලසුම් කර ගන්න.

පියවර 1 :
- අදාළ ගායන අංගයක කවියක් ශ්‍රවණය කිරීමට අවස්ථාව ලබා දී එහි සුවිශේෂතා සාකච්ඡා කිරීම.
  අක්ෂර නිවැරදි ව උච්චාරණය කරමින් තාලානුකූල ව ගායනය කිරීමට අවස්ථාව ලබාදීම.

පියවර 2 :
- ශිෂ්‍යයන් කණ්ඩායම් කීපයකට වෙන්කර ගායන අංග අභ්‍යාස කිරීම. මෙහි දී නිවැරදි ශ්‍රැතිය පිහිටුවා තාල තබමින් ගැයීමට අවශ්‍ය උපදෙස් ලබාදීම.

පියවර 3 :
- ගායන අංගවල විවිධත්වය හඳුනා ගනිමින් නිවැරදි නාදමාලාව අනුගමනය කරමින් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදීම.

පියවර 4 :
- නිවැරදි ව ගයන ශිෂ්‍යයන් තෝරා ගෙන ඔවුන්ගේ ගායන විලාසයන් අනුකරණය කිරීමට අවස්ථාව ලබාදීම. මෙහිදී කණ්ඩායම් වශයෙන් හෝ යුගල වශයෙන් ගායන කුසලතාව හඳුනා ගැනීම වැදගත් ය.

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :
- නියමිත ගායන තාල තබා ගායනය කරන්න.
- නියමිත ගායන අංග නිවැරදි නාදමාලාව අනුගමනය කරමින් ගායන කරන්න.
- කණ්ඩායම් වශයෙන් /යුගල වශයෙන් /ඒකල ව ගායන අංග ඉදිරිපත් කරන්න.
- සරල චලන භාවිත කරමින් ගායන අංග ඉදිරිපත් කරන්න.

---

**විෂය අන්තර්ගතය**

1වාරය - හටන් කවි, මෝල්ගස් කවි, මුසලඩි වන්නම/ශුද්ධ තාලය සින්දු වන්නම/කොවුලා වන්නම

2 වාරය - ග්‍රහපන්ති කවි, ප්‍රශස්ති කවි, 6 - 8 ශ්‍රේණිය දක්වා ඉගෙන ගත් වන්නම්

3වාරය - පන්තේරු කවි, 9 - 10 ශ්‍රේණිය ඉගෙන ගත් වන්නම්

**නිපුණතාව 5.0** : ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුම රැක ගැනීම සඳහා ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 5.1** : ශ්‍රී ලාංකේය නර්තන කලාව හා සබැඳි ඓතිහාසික පසුබිම විග්‍රහ කරයි.

**ක්‍රියාකාරකම 5.1.1** : වන්නම්වල පසුබිම හා විකාශනය අධ්‍යයනය කරමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03

**ඉගෙනුම් පල** :

- වන්නම් පිළිබඳ තොරතුරු ඇතුළත් ග්‍රන්ථ රචනා වී ඇති බව ප්‍රකාශ කරයි.
  වන්නම් නිර්මාණයට තුඩුදුන් හේතු සාකච්ඡා කරයි.
  වන්නම් හා සබැඳි වස්තු විෂයයන් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
  වන්නම් පිළිබඳ ඓතිහාසික තොරතුරු අධ්‍යයනය කිරීමට කැමැත්තෙන් ඉදිරිපත් වෙයි.

**ගුණාත්මක යෙදවුම්** : පොත්, සගරා, පුවත්පත් ලිපි, පින්තූර

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** :

- පාඩම ආරම්භ කිරීමට පෙර තොරතුරු ඇතුළත් ඇමුණුම්, කාර්ය පත්‍රිකා (පොත්, සගරා, සටහන්) සූදානම් කර ගන්න.

පියවර 1 :

- වන්නමක කොටසක් ගායනය කර හෝ නර්තනය කර ශිෂ්‍ය අදහස් විමසමින් වන්නම්වල පසුබිම පිළිබඳ සාකච්ඡාවක් මෙහෙයවන්න.

පියවර 2 :

- ශිෂ්‍යයන් කණ්ඩායම් කර ඇමුණුම් සහ කාර්ය පත්‍රිකා බෙදා දෙන්න. ඇමුණුමේ සඳහන් තොරතුරු පිළිබඳ හැඳින්වීමක් කර කාර්ය පත්‍රිකාව සම්පූර්ණ කිරීමට යොමු කිරිම.

පියවර 3 :

- ශිෂ්‍යයන් රැස් කළ තොරතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදීම.

පියවර 4

ශිෂ්‍යයන් ඉදිරිපත් කළ තොරතුරු ඇසුරෙන් සමාලෝචනයක් කිරීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

- වන්නම් පිළිබඳ තොරතුරු ඇතුළත් ව රචනා වී ඇති ග්‍රන්ථ දෙකක් නම් කරන්න.
- වන්නම් රචනයට තුඩුදුන් හේතු දක්වන්න.
- වන්නම්වල අන්තර්ගත වස්තු විෂයන් හඳුන්වන්න.
- වන්නම්වල පසුබිම හා විකාශනය පිළිබඳ තොරතුරු වාචික ව ඉදිරිපත් කිරීමට වැඩසටහන් සැලසුම් කරන්න.

**නිපුණතාව 5.0** : ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුම රැක ගැනීම සඳහා ක්‍රියාකරයි.

**නිපුණතා මට්ටම 5.1** : ශ්‍රී ලාංකේය නර්තන කලාව හා සබැඳි ඓතිහාසික පසුබිම විග්‍රහ කරයි.

**ක්‍රියාකාරකම 5.1.2** : නර්තන කලාවේ නූතන ප්‍රවණතා අධ්‍යයනය කරමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03

**ඉගෙනුම් පල** :

- අධ්‍යාපනික වශයෙන් ඇති වූ නව ප්‍රවණතා විස්තර කරයි.
- සමාජයීය අවශ්‍යතා සඳහා නර්තනය යොදා ගන්නා අයුරු සාකච්ඡා කරයි.
- නූතන තාක්ෂණ භාවිතය මගින් නර්තන ප්‍රාසංගික ව ඉස්මතු කොට දැක්විය හැකි බවට කරුණු ඉදිරිපත් කරයි.
- විවිධ නර්තන, නව නිර්මාණ බිහිවීම නර්තන කලාවේ ප්‍රගමනයට ඉවහල් වී ඇති බවට තොරතුරු ඉදිරිපත් කරයි.
- ව්‍යවහාරික නර්තනය, සමාජ සංස්කෘතික හා ආර්ථික අංග කෙරෙහි බලපාන අයුරු සාකච්ඡා කරයි.

**ගුණාත්මක යෙදවුම්** : V.C.D/පොත්පත්, ලිපි ලේඛන

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** :

පියවර 1 :
- අතීතයේ හා වර්තමානයේ නර්තනය සඳහා භාවිතයට ගත් රංග වස්ත්‍රාභරණ/සංගීතය/වේදිකා අලංකරණ පිළිබඳ වෙනස්කම් සාකච්ඡා කිරීම.

පියවර 2 :
- පහත සඳහන් කරුණු ඇසුරු කර ගනිමින් සාකච්ඡාවක් මෙහෙයවීම.
  - 1970න් පසු නර්තන අධ්‍යාපනයේ ඇතිවූ නව ප්‍රවණතා.
  - සමාජයිය අවශ්‍යතා සඳහා නර්තනය යොදාගත් අයුරු.
  - ප්‍රාසංගික බව වර්ධනය කිරීමට හා විවිධාංගිකරණය සඳහා තාක්ෂණය භාවිතය.
  - විවිධ නව නිර්මාණ බිහිවීම.
  - ව්‍යවහාරික නර්තන කලාව සමාජ සංස්කෘතික හා ආර්ථික අංග කෙරෙහි බලපා ඇති අයුරු.

පියවර 3 :
- ශිෂ්‍යයන් කණ්ඩායම් කර ඉහත සඳහන් මාතෘකා ඇතුළත් වන පරිදි තොරතුරු රැස් කිරීමට යොමු කිරීම.

පියවර 4
- එම තොරතුරු ඇසුරු කර ගනිමින් සමාලෝචනය කිරීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

- නර්තන කලාවේ නව ප්‍රවණතා දෙකක් නම් කරන්න.
- සමාජයිය අවශ්‍යතා සඳහා නර්තන භාවිත කරන අවස්ථා දෙකක් නම් කරන්න.
- ප්‍රාසංගික බව හා විවිධාංගිකරණය සඳහා භාවිත වන තාක්ෂණ උපක්‍රම දෙකක් ලියන්න.
- නව නර්තන නිර්මාණ නර්තන කලාවේ ප්‍රගමනයට හේතු වන අයුරු විමසන්න.
- ව්‍යවහාරික නර්තනය, වෘත්තීය ශිල්පීන් බිහිවීම පිළිබඳ අදහස් දක්වන්න.

**නිපුණතාව 5.0** : ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුම රැක ගැනීම සඳහා ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 5.2** : ශ්‍රී ලාංකේය නර්තන කලාවේ සාහිත්‍ය කලා පෝෂණය සඳහා දායක වූ පර්යේෂණාත්මක ලේඛන/කෘති පිළිබඳ තොරතුරු විස්තර කරයි.

**ක්‍රියාකාරකම 5.2** : පර්යේෂණාත්මක ලේඛන/කෘති පිළිබඳ තොරතුරු අධ්‍යයනය කරමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :
- ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදායයන්ට අයත් පර්යේෂණාත්මක ග්‍රන්ථ හා කතුවරුන් නම් කරයි.
- නර්තන අධ්‍යාපනයේ ප්‍රගමනයට මෙම පර්යේෂණ ලේඛන/කෘති ඉවහල් වී ඇති අයුරු විස්තර කරයි.
- විවිධ විෂය ක්ෂේත්‍ර යටතේ මෙම පර්යේෂණ සිදු කර ඇති ආකාරය සාකච්ඡා කරයි.

**ගුණාත්මක යෙදවුම්** : ග්‍රන්ථ, ලිපි ලේඛන

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** :

පියවර 1 :
- නර්තන කලාව පිළිබඳ ලියවී ඇති පොත්පත් පිළිබඳ තොරතුරු විමසා කරුණු සාකච්ඡා කිරීම.

පියවර 2
- පර්යේෂණ ග්‍රන්ථ හා එම ග්‍රන්ථවල ඇතුළත් තොරතුරු පිළිබඳ පහත සඳහන් ශීර්ෂ යටතේ කරුණු රැස් කිරීම.

1. ලේඛකයාගේ නම
2. පර්යේෂණ කෘතිය
3. විෂය ක්ෂේත්‍රය
4. අන්තර්ගත කරුණු සැකෙවින්

පියවර 3 :
- රැස් කරගත් තොරතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදීම.

පියවර 5
- ඉදිරිපත් කරන ලද තොරතුරු ඇසුරෙන් සමාලෝචනයක් කිරීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

- නර්තන කලාව හා සම්බන්ධ පර්යේෂණ ලේඛන/කෘති හතරක් හා කතුවරුන් හතර දෙනෙකු නම් කරන්න.
- නර්තන කලාවේ ප්‍රගමනයට එම ලේඛන/කෘති ඉවහල් වී ඇති ආකාරය විස්තර කරන්න.
- මෙම පර්යේෂණ සිදු කර ඇති විෂය ක්ෂේත්‍ර මොනවාදැයි දක්වන්න.
- එක් පර්යේෂණ ලේඛනයක/කෘතියක අන්තර්ගත විශේෂ කරුණු සැකෙවින් දක්වන්න.

**නිපුණතාව 5.0** : ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුම රැක ගැනීම සඳහා ක්‍රියාකරයි.

**නිපුණතා මට්ටම 5.3** : ශ්‍රී ලාංකේය ගැමි නාටක හා සබැඳි පසුබිම අධ්‍යයනය කර සුවිශේෂ ලක්ෂණ ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම 5.3** : කෝලම් නාටක පිළිබඳ තොරතුරු අධ්‍යයනය කරමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03

**ඉගෙනුම් පල** :
- කෝලම් නාටක ප්‍රචලිත ප්‍රදේශ නම්කරයි.
- කෝලම් නාටක පැවැත්වීමේ අතීත හා වර්තමාන හේතු සාකච්ඡා කරයි.
- කෝලම් නාටකවල නර්තන, ගායන,වාදන, රංග භූමිය හා රංග වස්ත්‍රාභරණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- මෙම නාටකවලින් සමාජ විවරණයන් සිදු වන බව ප්‍රකාශ කරයි.

**ගුණාත්මක යෙදවුම්** : VCD, පොත්පත්, පින්තූර, ඇමුණුම්, කාර්ය පත්‍රිකා

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** : පාඩම සැලසුම් කිරීමේ දී ඇමුණුම් කාර්ය පත්‍රිකා හා ඉගෙනුම් - ඉගැන්වීම් ආධාරක සූදානම් කරගැනීම

පියවර 1
- කෝලම් නාටක හා සබැඳි නර්තනයක් /ගායනයක් /සංවාද කොටසක් VCD පටියක් ඇසුරෙන් සාකච්ඡාවක් මෙහෙයවීම.

පියවර 2 :
- ශිෂ්‍යයන් කණ්ඩායම්කර ඇමුණුම් හා කාර්ය පත්‍රිකා ඇසුරු කර ගනිමින් පාඩමට අදාළ කරුණු රැස්කිරීමට යොමුකරවීම

පියවර 3 :
- රැස් කළ කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදීම

පියවර 4
- එම කරුණු හා ගුරුවරයා සතු සුවිශේෂ කරුණු ද අදාළ කර ගනිමින් සමාලෝචනය කිරීම

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :
- කෝලම් නාටක ප්‍රචලිත ප්‍රදේශ නම් කරන්න.
- කෝලම් නාටක පැවැත්වීමේ අතීත හා වර්තමාන හේතු දෙක බැගින් ඉදිරිපත් කරන්න.
- එහි රඟමඩල පිළිබඳ කෙටි විස්තරයක් කරන්න.
- කෝලම් නාටකයක නර්තන, ගායන, වාදන රංගවස්ත්‍රාභරණ පිළිබඳ විස්තර කරන්න.
- කෝලම් නාටක චරිත මගින් සමාජ විවරණයක් සිදු කෙරෙන ආකාරය විස්තර කරන්න.
- කෝලම් නාටකයක කවියක් ගායනය කරන්න.

කාර්ය පත්‍රිකාව කෝලම් නාටකය පිළිබඳ තොරතුරු

| පිරික්සුම | තොරතුරු |
|---|---|
| කෝළම් නාටක ප්‍රචලිත ප්‍රදේශ දෙකක් නම් කරන්න | 1.<br>2. |
| පැවැත්වීමේ අරමුණු තුනක් දක්වන්න | 1.<br>2.<br>3. |
| කෝලම් නාටකයක චරිත දෙකක් නම් කර විස්තර කිරීම | 1.<br>2.<br>1.<br>2. |
| රංගභූමිය සකස් කර ඇති අයුරු දක්වන්න | |
| නර්තන, ගායන, වාදන භාවිතයට ගෙන ඇති අයුරු විස්තර කරන්න | |
| සමාජ විචාරය සිදු කෙරෙන අයුරු කවියක් ඇසුරෙන් විග්‍රහ කරන්න. | |

**නිපුණතාව 6.0** : රසඥතා වර්ධනය සඳහා විවිධ කලාංගවල සුවිශේෂ ලක්ෂණ විචාරයට ලක්කරයි.

**නිපුණතා මට්ටම 6.1** : රූපවාහිනී නාලිකාවල විකාශය වන නර්තන අංග විචාරයට ලක්කරයි.

**ක්‍රියාකාරකම 6.1** : රූපවාහිනී නාලිකාවල විකාශය වන අද්‍යතන නර්තන වැඩසටහන් අගයමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :
- රූපවාහිනී නාලිකාවල විකාශය වන අද්‍යතන නර්තන වැඩසටහන් නම් කරයි.
- එම වැඩසටහන්වල දක්නට ලැබෙන නර්තන අංග පිළිබඳ අදහස් දක්වයි.
- නර්තනය විචිත්‍රවත් කිරීමට යොදාගත් ක්‍රමෝපායයන් පිළිබඳ සාකච්ඡා කරයි.

**ගුණාත්මක යෙදවුම්** : VCD, පින්තූර, ඇමුණුම්, කාර්ය පත්‍රිකා

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** : පාඩමට අදාළ කාර්ය පත්‍රිකාවක් සකස් කරගන්න.

**පියවර 1**
- රූපවාහිනී නාලිකාවල විකාශය වන අද්‍යතන, නර්තන වැඩසටහනක කොටසක් නැරඹීමට සැලැස්වීම.

**පියවර 2** :
- කාර්ය පත්‍රිකාව බෙදා දී සාකච්ඡා කිරීමට යෝජිත කරුණු පිළිබඳ ව දැනුවත් කරවීම.

**පියවර 3** :
- පහසුකම් තිබේනම් සිසුන් කණ්ඩායම් කර වැඩසටහනක් නැවත නැරඹීමට සැලැස්වීම

**පියවර 4**
- කාර්ය පත්‍රිකාවට අනුව සාකච්ඡා කරමින් කරුණු රැස්කර ගැනීමට අවස්ථාව ලබාදීම.

**පියවර 5**
- රැස් කර ගත් කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදීම.
- එම කරුණු ඇසුරෙන් සමාලෝචනයක් කිරීම

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

- රූපවාහිනී නාලිකාවල විකාශය වන නර්තන වැඩසටහන් තුනක් නම් කරන්න.
- එම වැඩසටහනක දක්නට ලැබෙන නර්තන අංග පිළිබඳ හැඳින්වීමක් කරන්න.
- නර්තනය විචිත්‍රවත් කිරීමට යොදාගත් උපක්‍රම මොනවාදැයි දක්වන්න.
- ඔබ නැරඹූ නර්තන අංගයක් පිළිබඳ ඇගයීමක් කරන්න.

කාර්ය පත්‍රිකාව රූපවාහිනී නාලිකාවල විකාශය වන අද්‍යතන වැඩසටහන්

| පිරික්සුම | ගවේෂණය කරන ලද තොරතුරු |
|---|---|
| රූපවාහිනී නාලිකාවල විකාශය වන අද්‍යතන වැඩසටහන් තුනක් නම් කරන්න. | 1.<br>2.<br>3. |
| එක් වැඩසටහනක් තෝරාගෙන කරුණු දක්වන්න | |
| නර්තන භාවිතයට ගත් අයුරු<br><br>රංගවස්ත්‍ර නිර්මාණය<br><br>සංගීතය හා වාද්‍ය භාණ්ඩ<br><br>ප්‍රේක්ෂක ප්‍රතිචාරය සඳහා භාවිතයට ගත් විධික්‍රම<br><br>සමස්තයක් ලෙස ඇගයීමක් කරන්න. | |

**නිපුණතාව 6.0** : රසඥතා වර්ධනය සඳහා විවිධ කලාංගවල සුවිශේෂ ලක්ෂණ විචාරයට ලක්කරයි.

**නිපුණතා මට්ටම 6.2** : වෙනත් සංස්කෘතියකට අයත් නර්තන සම්ප්‍රදායන් අධ්‍යයනය කරමින් තොරතුරු ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම 6.2** : මනිපූරි නර්තන සම්ප්‍රදාය පිළිබඳ තොරතුරු රැස්කරමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 04

**ඉගෙනුම් පල** :

- මනිපූරි නර්තන සම්ප්‍රදාය ප්‍රචලිත ප්‍රදේශ නම් කරයි.
- මනිපූරි නර්තන සම්ප්‍රදායේ ආගමික පසුබිම පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- නර්තන, සංගීතය හා රංගවස්ත්‍රාභරණවල සුවිශේෂ ලක්ෂණ සාකච්ඡා කරයි.
- වාද්‍ය භාණ්ඩයක රූප සටහනක් ඇඳ නම් කරයි.

**ගුණාත්මක යෙදවුම්** : VCD, පින්තූර, පොත්පත් /ලිපි ලේඛන, කාර්ය පත්‍රිකා

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** : මනිපූරි නර්තන සම්ප්‍රදාය පිළිබඳ තොරතුරු ඇතුළත් කිරීමට කාර්යය පත්‍රිකාවක් සකස් කරගන්න.

පියවර 1

- VCD හෝ පින්තූරයක් ඇසුරෙන් හෝ රාධා ක්‍රිෂ්ණ පිළිබඳ ජන ප්‍රවාදයන් හෝ ලබාගත් තොරතුරු ඇසුරු කරගනිමින් සාකච්ඡාවක් මෙහෙයවීම.

පියවර 2 :

- පහත සඳහන් ශීර්ෂ යටතේ කරුණු රැස්කර ගැනීම සඳහා යොමුකරවීම.
    - ප්‍රචලිත ප්‍රදේශ
    - ආරම්භය හා විකාශනය
    - සංගීත සම්ප්‍රදාය, වාද්‍ය භාණ්ඩ ,රංග වස්ත්‍රාභරණ, නර්තන අංග

පියවර 3 :

- රැස් කරගත් කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදීම.

පියවර 4

- ඉදිරිපත් කරන ලද කරුණු පිළිබඳ සමාලෝචනයක් කිරීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

- මනිපූරි නර්තන සම්ප්‍රදාය පිළිබඳ හැඳින්වීමක් කරන්න.
- මනිපූරි නර්තන සම්ප්‍රදායේ දක්නට ලැබෙන නර්තන අංග දෙකක් නම් කරන්න.
- යොදා ගන්නා සංගීත සම්ප්‍රදාය නම්කර වාද්‍ය භාණ්ඩයක රූප සටහනක් අඳින්න.
- රංග වස්ත්‍රාභරණයක සුවිශේෂ ලක්ෂණ විස්තර කරන්න.

**නිපුණතාව 7.0** : විවිධ අත්දැකීම් ඇසුරු කරගනිමින් කලාංග නිර්මාණ කරයි.

**නිපුණතා මට්ටම 7.1** : ප්‍රාසංගික නර්තන අංගයක් නිර්මාණය කරයි.

**ක්‍රියාකාරකම 7.1** : ගීතයට අනුව නර්තන නිර්මාණය කරමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 04

**ඉගෙනුම් පල** :
- ගීතය ශ්‍රවණය කර ඒ පිළිබඳ අදහස් දක්වයි.
- ගීතයේ පසුබිම විස්තර කරයි.
- තාල තබමින් ගීතය ගායනය කරයි.
- ගීතයේ අදහස් ඉදිරිපත් කිරීමට ආංගික හා සාත්වික අභින භාවිත කරමින් නර්තන නිර්මාණය කරයි.
- අවකාශය නිසි අයුරින් භාවිත කරමින් ප්‍රාසංගික නර්තන අංගයක් සාමූහිකත්වයෙන් යුතු ව නිර්මාණය කරයි.
- නිර්මාණය කරන ලද නර්තන අංග පිළිබඳ අදහස් දක්වයි.

**ගුණාත්මක යෙදවුම්** : CD පට, ගීතය සටහන් කරන ලද පත්‍රිකාව

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** :

පියවර 1 :
- විජයතුමා තම්මැන්නේ /වාසනා දිනේකි මේක... ගීතය, ශ්‍රවණය කිරීමට සලස්වා එහි පසුබිම පිළිබඳ සාකච්ඡා කිරීම.

පියවර 2 :
- ගීතය කොටස් වශයෙන් ගායනය කරවීම.

පියවර 3 :
- ශිෂ්‍යයින් කණ්ඩායම්කර ගීතයට අනුව නර්තන නිර්මාණ කරගැනීමට අවස්ථාව ලබාදීම.
- නිර්මාණය කරන ලද කොටස් අභ්‍යාස කිරීමට යොමු කරවීම.

පියවර 4
- නිර්මාණය කරන ලද නර්තන අංගය ඉදිරිපත් කිරීමට සලස්වා ශිෂ්‍ය අදහස් විමසීම.

පියවර 5
- නර්තන නිර්මාණ පිළිබඳ සමාලෝචනයක් කිරීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :
- ගීතයේ පසුබිම විස්තර කරන්න.
- තාල තබමින් ගීතයේ කොටසක් ගායනය කරන්න.
- කණ්ඩායම් විසින් නිර්මාණය කරන ලද නර්තනයේ කොටසක් ඉදිරිපත් කරන්න.
- නිර්මාණය කරන ලද නර්තන අංග පිළිබඳ අදහස් දක්වන්න.

**නිපුණතාව 7.0** : විවිධ අත්දැකීම් ඇසුරු කරගනිමින් කලාංග නිර්මාණය කරයි.

**නිපුණතා මට්ටම 7.2** : ප්‍රාසංගික ලක්ෂණ ප්‍රදර්ශනය වන පරිදි අංග රචනය කරයි.

**ක්‍රියාකාරකම 7.2** : නර්තන අංග සඳහා අංග රචනය කරමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03

**ඉගෙනුම් පල** :
- සාම්ප්‍රදායික හා නව නිර්මාණ නර්තන අංග සඳහා අංග රචනය කිරීමේ විධික්‍රම සාකච්ඡා කරයි.
- වර්ණ සංකලනය පිළිබඳ අවබෝධයෙන් යුතු ව කටයුතු කරයි.
- නර්තන අංගය, අංග රචනය කළයුතු ආකාරය පිළිබඳ සැලැස්මක් පිළියෙල කරයි.
- අංග රචනය සඳහා යොදාගන්නා ද්‍රව්‍ය හා උපකරණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- සාම්ප්‍රදායික හෝ නව නිර්මාණ නර්තන අංගයන් සඳහා අංග රචනය කරයි.

**ගුණාත්මක යෙදවුම්** : පින්තූර/අංග රචනය ද්‍රව්‍ය හා උපකරණ

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** :

පියවර 1 :
- අංග රචනය පිළිබඳ සරල ක්‍රියාකාරකමක් මගින් පිවිසීම.

පියවර 2 :
- අංග රචනා කිරීමේ විධික්‍රම හඳුන්වා දීම.

පියවර 3 :
- සාම්ප්‍රදායික හා නිර්මාණාත්මක අංග රචනය සඳහා යුගල වශයෙන් ක්‍රියාකාරකමෙ හි යෙදීමට අවස්ථාව ලබාදීම

පියවර 4
- ක්‍රියාකාරකම් ඇගයීමට ලක්කරමින් සමාලෝචනයක් කිරීම

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :
- අංග රචනා සඳහා භාවිතයට ගන්නා ද්‍රව්‍ය හා උපකරණ නම් කරන්න.
- අංග රචනා විධික්‍රම විස්තර කරන්න.
- සාම්ප්‍රදායික හෝ නව නිර්මාණ, නර්තන අංගයන් සඳහා අංග රචනයක් කරන්න.

**නිපුණතාව 8.0** : නර්තන කලාවෙන් ලැබෙන මානසික හා ශාරීරික සුවසම්පත සාර්ථක දිවි පෙවෙතක් ගත කිරීමට ඉවහල් කරගනියි.

**නිපුණතා මට්ටම 8.1** : නර්තන කලාව හැදෑරීමෙන් අත්පත් කරගත් පුද්ගල වටිනාකම් අගයමින් විස්තර කරයි.

**ක්‍රියාකාරකම 8.1** : නර්තන කලාව හැදෑරීමේ වටිනාකම අගයමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03

**ඉගෙනුම් පල** :

- නර්තනයෙහි යෙදීමෙන්/නැරඹීමෙන් සතුටක් ලැබෙන බව ප්‍රකාශ කරයි.
- ප්‍රායෝගික ව නර්තනයෙහි යෙදීමෙන් ශාරීරික නම්‍යතාව පවත්වාගත හැකි බවට කරුණු දක්වයි.
- නර්තනය හා බැඳි සාරධර්ම යහපත් දිවිපෙවතකට ඉවහල් වන බව විස්තර කරයි.
- ශාරීරික නිරෝගීභාව සඳහා නර්තන හා බැඳි ක්‍රියාකාරකම්වල යෙදීමේ වැදගත්කම සාකච්ඡා කරයි.

**ගුණාත්මක යෙදවුම්** : පුවත්පත්, ලිපිලේඛන, සඟරා

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** :

පියවර 1 :
- නර්තන කලාව ශාරීරික සුවසම්පත සඳහා කෙසේ වැදගත් වන්නේ දැයි සාකච්ඡා කිරීම.

පියවර 2 :
- නර්තන කලාව මානසික සුවය සඳහා කෙසේ ඉවහල් වන්නේ දැයි සාකච්ඡා කිරීම.

පියවර 3 :
- නර්තන කලාවේ සාරධර්ම යහපත් දිවිපැවැත්මකට බලපාන අයුරු සාකච්ඡා කිරීම.

පියවර 4
- අදාළ කරුණු ගොනු කරගනිමින් සමාලෝචනයක් කිරීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

- නර්තන කලාවේ යෙදීමෙන් ශරීර සුවතාව පවත්වා ගන්නේ කෙසේ දැයි විස්තර කරන්න.
- මානසික සුවතාව සඳහා නර්තනය යොදාගන්නා අයුරු විස්තර කරන්න.
- යහපත් දිවිපැවැත්ම සඳහා නර්තන කලාව හා බැඳි සාරධර්ම වැදගත් වන අයුරු විස්තර කරන්න.

**නිපුණතාව 8.0** : නර්තන කලාවෙන් ලැබෙන මානසික හා ශාරීරික සුවසම්පත සාර්ථක දිවි පෙවෙතක් ගත කිරීමට ඉවහල් කරගනියි.

**නිපුණතා මට්ටම 8.2** : නර්තන කලාව හැදෑරීමෙන් අත්පත් කරගන්නා සමාජයීය වටිනාකම් පිළිබඳ අදහස් දක්වයි.

**ක්‍රියාකාරකම 8.2** : නර්තන කලාවේ සමාජයීය වටිනාකම අගයමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 04

**ඉගෙනුම් පල** :

- නර්තනය හා සබැඳි කටයුතුවල නිරතවීමෙන් සහජීවනය හා මානව සම්බන්ධතා ගොඩනැගෙන බව ප්‍රකාශ කරයි.
- කණ්ඩායම් වශයෙන් කටයුතු කිරීමේදී නායකත්ව ගුණාංග වර්ධනය කරගත හැකි බව සාකච්ඡා කරයි.
- දේශිය සංස්කෘතික අංග ඉදිරිපත් කිරීම මගින් අන්තර්ජාතික සබඳතා ගොඩනැගෙන බව විස්තර කරයි.
- වේදිකා ප්‍රසංග මගින් විනෝදාස්වාදය සහ කලා නිර්මාණ වර්ධනය වන බවට තොරතුරු ඉදිරිපත් කරයි.
- සමාජගත පොදු සිරිත් විරිත් (චාරිත්‍ර, වාරිත්‍ර) නර්තන කලාවේ දී භාවිතයට ගනියි.

**ගුණාත්මක යෙදවුම්** : කාර්ය පත්‍රිකා, පැවරුම්, පින්තූර, පුවත්පත් ලිපි

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** : පින්තූර, පුවත්පත් ලිපි ආදිය සූදානම් කර ගැනීම.

පියවර 1 :

- නර්තන කලාව ඉගෙනීමෙන් පුද්ගලයාට මෙන්ම ප්‍රජාවට අත්පත් වන වටිනාකම් පිළිබඳ සාකච්ඡාවක් මෙහෙයවීම.

පියවර 2 :

- අද්‍යතනයේ කලා ශිල්පීන් මෙන් ම නර්තන කණ්ඩායම් තම ජීවන වෘත්තිය සඳහා නර්තන කටයුතුවල නිරතවීම හා ඔවුන් සමාජ ගෞරවයට පාත්‍රවීම පිළිබඳවත් ඔවුන්ගේ දායකත්වය සමාජ සංස්කෘතික හා ආර්ථික වර්ධනයට බලපාන අයුරුත් සාකච්ඡා කිරීම.

පියවර 3 :

- නර්තන කලාව හා බැඳි සමාජ වටිනාකම් දැක්වීම සඳහා කාර්ය පත්‍රිකා ශිෂ්‍යයන් අතර /කණ්ඩායම් අතර බෙදාදීම.
- කාර්ය පත්‍රිකාවේ තොරතුරු දැක්වීම සඳහා එහි ශිර්ෂ පිළිබඳ කෙටි හැඳින්වීමක් කිරීම.
- සාකච්ඡා කරමින් කාර්ය පත්‍රිකා සම්පූර්ණ කිරීමට අවස්ථාව ලබාදීම.

පියවර 4

- ශිෂ්‍යයන් විසින් සම්පූර්ණ කරන ලද කාර්ය පත්‍රිකා පිළිබඳ විමසීමක් කිරීම.
- කාර්ය පත්‍රිකාවල සඳහන් කරුණුවලට අමතර ව පාඩමට අදාළ තවත් යෝජනා පිළිබඳ විමසමින් සමාලෝචනයක් කිරීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

- නර්තනය හැදෑරීමෙන් අත්පත් කරගන්නා යහපත් ගුණාංග තුනක් නම් කරන්න.
- කායික හා මානසික වර්ධනයට එම ගුණාංග බලපාන අයුරු විස්තර කරන්න.
- සමාජ සංස්කෘතික හා ආර්ථික වර්ධනයට නර්තනය හා බැඳි කටයුතු ඉවහල්වන අයුරු විමසන්න.
- 'ජාත්‍යන්තර කරලියට යන අපේ නර්තන කලාව' යන තේමාව යටතේ පුවත්පතකට ලිපියක් සකස් කරන්න.

**විවිධ සහාය**

| | |
|---|---|
| **කංචුක නිර්මාණය** | ඊ.එල්.ඒ.කේ.ලියනගේ මයා<br>ජාතික අධ්‍යාපන ආයතනය. |
| **පරිගණක වදන් සැපයුම** | ඊ.එල්.පෙරේරා මිය<br>ජාතික අධ්‍යාපන ආයතනය. |
| **විවිධ සහාය** | මාලනී වික්‍රමනායක මිය<br>ජාතික අධ්‍යාපන ආයතනය. |
| | කේ.පී. පෙරේරා මයා<br>ජාතික අධ්‍යාපන ආයතනය. |